# 2022

# වාර්ෂික වාර්තාව

# ஆண்டறிக்கை

# Annual Report



## කිතුල් සංවර්ධන මණ්ඩලය

## கித்துல் அபிவிருத்திச் சபை

## Kithul Development Board

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சு

Ministry of Plantation and Community Infrastructure

# වාර්ෂික වාර්තාව 2022
# ஆண்டறிக்கை 2022
# Annual Report 2022

## කිතුල් සංවර්ධන මණ්ඩලය
## கித்துல் அபிவிருத்திச் சபை
## Kithul Development Board

**වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය**

**பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சு**

**Ministry of Plantation and Community Infrastructure**

## දැක්ම
### தொலைநோக்கு
### Vision

ශ්‍රී ලංකාවේ කිතුල් කර්මාන්තයේ
තිරසාර සංවර්ධනය උත්ප්‍රේරණය කිරීම.
இலங்கையின் கித்துல் கைத்தொழிலின் நிலையான வளர்ச்சிக்கு
உந்துசக்தியாக இருத்தல்.
To be the catalyst for a sustainable development of
Kithul industry in Sri Lanka.

---

## මෙහෙවර
### செயற்பணி
### Mission

ජාත්‍යන්තර වෙළඳපොළ ජය ගනිමින්
කිතුල් කර්මාන්තයේ තිරසාර සංවර්ධනයට පහසුකම් සැලසීම
තුළින් අදාළ පාර්ශවයන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම
சர்வதேச சந்தையை வெற்றிகொண்டு கித்துல் கைத்தொழிலுக்கு
நிலையான பொருளாதார அபிவிருத்திக்கான வசதிகளை வழங்குவதன்
மூலம் உரிய தரப்பினரின் வாழ்வாதாரத்தை மேம்படுத்தல்
To improve living standards of relevant stakeholders
by facilitating sustainable development of the
Kithul industry through success achieved
in the international market.

# වාර්ෂික වාර්තාව
# 2022

# පෙළගැස්ම

01. සභාපතිතුමාගේ සමාලෝචනය....1

02. සාමාන්‍යාධිකාරීතුමියගේ සමාලෝචනය ....2

03. අධ්‍යක්ෂ මණ්ඩලයේ සමාලෝචනය ....3

04. කිතුල් සංවර්ධන මණ්ඩලයේ සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය ....3

05. විධායක කළමනාකරණ කණ්ඩායම ....3

06. ආයතනික තොරතුරු ....4

6.1 සංවිධාන ව්‍යුහය ....5

6.2 ආයතනයේ අරමුණු ....6

6.3 ආයතනයේ බලතල ....7

6.4 ප්‍රධාන කාර්යයන්....8

6.5 ආයතනික පාලනය ....8

07. වත්මන් සම්පත් ....9

7.1 ඓතිහාසික වටිනාකම් ....9

7.2 වත්මන් අගයන් ....10

7.3 පවතින ශක්තීන්, දුර්වලතා, අවස්ථා සහ තර්ජන ....10

7.4 විශේෂ ව්‍යාපෘතිවල ප්‍රගතිය (2022.12.31 දිනට)....12

7.5 කිතුල් හකුරු සහ පැණි අපනයනය ....14

08. කිතුල් සංවර්ධන මණ්ඩලය විසින් 2022 වර්ෂයේදී නිම කරන ලද ව්‍යාපෘති ....17

8.1 උපාය මාර්ගික සැලැස්මක් සැකසීම. ....17

8.2. උපාය මාර්ගික සැලැස්ම අතිගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කිරීම....18

8.3 ගෘහ කර්මාන්තය සඳහා ආරක්ෂක උපකරණ කට්ටල ලබා දීම. ....22

8.4 කිතුල් ගොවි සමිති සංවිධානය කිරීම....22

8.5 කිතුල් සංචාරක සත්කාරක ගම්මාන (ලංකා ගම) ....26

8.6 උසස් තත්වයේ කිතුල් නිෂ්පාදන අලෙවි කිරීමට අවශ්‍ය තාක්ෂණික මැදිහත් වීම. ....27

8.7 කිතුල් ගස් ප්‍රමාණය වැඩි කිරීම සඳහා තවාන් සංවර්ධනය හා කිතුල් වගාව රට තුළ වාණිජ මෙහෙයුමක් ලෙස පරිවර්තනය කිරීම. ....27

09. විගණකාධිපති වාර්තාව ....29

10. මූල්‍ය වාර්තා ....35

10.1 මූල්‍ය තත්ව ප්‍රකාශය....35

10.2 මූල්‍ය කාර්ය සාධනය ....36

10.3 මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය ....37

10.4 දේපළ, පිරියත , උපකරණ ....38

10.5 සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති ....39

11.ජාතික විගනණ වාර්තාවේ පෙන්වා දී ඇති දූර්වලතා නිවැරදි කිරීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග....42

## 01. සභාපතිතුමාගේ සමාලෝචනය

කිතුල් වගාව ආසියානු කලාපයේ බොහෝ රටවල දක්නට ලැබෙන ශාකයක් වුවත් ඒ හා බැඳුණු ගෘහස්ථ කර්මාන්තයන් දක්නට ලැබෙන්නේ ශ්‍රී ලංකාවේ පමණි. 2021 මාර්තු 17 වන දින අංක 2219/37 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් ස්ථාපනය කරන ලද කිතුල් සංවර්ධන මණ්ඩලයේ සභාපති වශයෙන් මා පත් කොට එහි ක්‍රියාත්මකභාවය උදෙසා අධ්‍යක්ෂ මණ්ඩලයක්ද පත් කොට රාජ්‍ය ව්‍යවස්ථාපිත මණ්ඩලයක් වශයෙන් ක්‍රියාත්මක වීමට අවශ්‍ය විධිවිධාන සකස් කර පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධන හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණය රාජ්‍ය අමාත්‍යාංශය යටතට පත් කොට ඇත. කිතුල් පැණි හා හකුරු නිෂ්පාදනය පිළිබඳ ඉතිහාසය අවුරුදු සිය ගණනක් ඈතට විහිදුනත් වර්තමානයේ එම කර්මාන්තය පවතින්නේ මන්දගාමී ගෘහ කර්මාන්තයක් වශයෙන් බව අප සැම දන්නා කරුණකි.

අතිගරු ජනාධිපතිතුමාගේ සුවිශේෂ උපදෙස් මත වැවිලි අමාත්‍යාංශයේ මැදිහත් වීමෙන් ස්ථාපනය වූ මෙම මණ්ඩලයට කිතුල් කර්මාන්තයේ නියැලුණු පිරිස හඳුනාගනිමින් දේශීය හා විදේශීය වෙළඳපල තුළ පවතින නව ප්‍රවණතා හඳුනාගනිමින් යැපුම් මට්ටමෙ ජීවත් වන සාම්ප්‍රදායික කර්මාන්තකරුවන්ගේ තත්වයෙන් මුදවා ගෙන නූතන තාක්ෂණ මෙවලම් භාවිත කරමින් කිතුල් නිෂ්පාදනවල පවතින අව්‍යාජ ගති ලක්ෂණ ආරක්ෂා කර ගනිමින් නවීන තාක්ෂණය භාවිත කරන නිෂ්පාදන විවිධාංගීකරණය කෙරෙහි ප්‍රාගුණ්‍යයක් ලත් ව්‍යවසායකයන් ලෙස ශ්‍රී ලංකා සමාජ තලයේ ඉහළට ඔසවා තබන්නට අවශ්‍ය ක්‍රමෝපායන් හඳුනා ගෙන ක්‍රියාත්මක කිරීම කිතුල් සංවර්ධන මණ්ඩලයට පැවරෙන ප්‍රධාන වගකීමක් බව අප දැනටමත් අවධාරණය කරගෙන ඇත්තෙමු.

මෙම අභියෝගාත්මක ගමනේ කාර්ය සාධනයක් පෙන්නුම් කරමින්, සාර්ථකව ක්‍රියාත්මන වීම සඳහා වැවිලි අමාත්‍ය ගරු රමේෂ් පතිරණ මැතිතුමාගෙන් ලැබෙන මහපෙන්වීම සහ රේඛීය අමාත්‍යාංශයේ සහ රාජ්‍ය අමාත්‍යාංශවල ලේකම්තුමන්ලාගෙන් ලැබෙන සහයෝගය විශාල පිටුබලයක් සපයනු ඇත.

අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2022 පෙබරවාරි 17 වන දින ගාල්ලේ දී පැවැත්වෙන කිතුල් සංවර්ධන මණ්ඩලයේ ඉදිරි ගමන්මඟ එළි දැක්වීමේ වැඩසටහන, පවතින අභියෝග සියල්ල ජය ගනිමින් ශ්‍රී ලංකාවේ අනන්‍යතාවය පිළිබිඹු කළ හැකි කිතුල් නිෂ්පාදන දේශීය වෙළෙඳපල සහ අපනයන වෙළඳපොළ දක්වා ප්‍රවර්ධනය කොට එයින් ජීවනෝපාය සලසා ගන්නා පිරිසට යහපතක් සැලසීමට සුභදායි ආරම්භයක් සනිටුහන් කර ඇත.

ඒ සඳහා මගේ සුබාශිංසන පිරිනමනු කැමැත්තෙමි.<br>
ගිහාන් පෙරේරා (නීතිඥ)<br>
සභාපති<br>
කිතුල් සංවර්ධන මණ්ඩලය

## 02. සාමාන්‍යාධිකාරීතුමියගේ සමාලෝචනය

ප්‍රථමයෙන් කිතුල් සංවර්ධන මණ්ඩලයේ 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලසුම් සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා සහය දුන් සැමට අපගේ අවංක ප්‍රණාමය පුද කිරීමට කැමැත්තෙමු. එසේම 2021 වර්ෂයේ කිතුල් සංවර්ධන මණ්ඩලය පිහිටුවීමට වැවිලි කර්මාන්ත අමාත්‍ය ගරු වෛද්‍ය රමේෂ් පතිරණ මැතිතුමා දක්වන ලද අමිල නායකත්වය වෙනුවෙන් අපගේ හෘදයාංගම ප්‍රණාමය පුදකර සිටින අතර, අපගේ කාර්යයන් ඵලදායී හා කාර්යක්ෂම ලෙස ඉටු කර ගැනීමට එතුමා විසින් ලබාදෙන ස්ථිරසාර නායකත්වය හා අභිප්‍රේරණය මහඟු රුකුලක් බව සඟිපත් කරමු. කිතුල් සංවර්ධන මණ්ඩලයේ වැඩකටයුතු වෙනුවෙන් වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍ය ලොහාන් රත්වත්තේ මැතිතුමා දක්වන දායකත්වය වෙනුවෙන් ද අපගේ ප්‍රශංසාව පුද කිරීමට කැමැත්තෙමු.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නිරන්තර මඟපෙන්වීම්, යෝජනා සහ දිරිගැන්වීම් ඉතා වැදගත් වූ අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ මඟපෙන්වීම වෙනුවෙන් ස්තුතිය පිරිනමමි.

පුද්ගලික වශයෙන්ද ලබාදෙන අමිල සහයෝගය ඉතා අගය කොට සලකමි. මෙහිදී කිතුල් ක්ෂේත්‍රය කෙරෙහි උනන්දුවක් දක්වන බාහිර පාර්ශවකරුවන් විසින් ලබා දෙන ලද ඵලදායි යෙදවුම්, අපගේ ආයතනික රාමුව සහ ක්‍රියාකාරකම් සකස් කිරීමේ දී සහ ක්‍රියාත්මක කිරීමේ දී මහත් සේ උපකාරී වී ඇත.

මෙම වාර්ෂික වාර්තාව මඟින් 2022 වර්ෂයට අදාළ ක්‍රියාත්මක සැලැස්ම අනුව යමින් ඵලදායි ලෙස ශ්‍රී ලාංකීය කිතුල් කර්මාන්තය නංවාලීමට සහ එය රටට තිරසාර ආර්ථික වර්ධනයක් ගෙන ඒමට කරන ලද කාර්යයන් සමාලෝචනය කරනු ඇත. නැවත වරක් මෙම ප්‍රයත්නය සඳහා අපට සහය දුන් සැමට අපගේ හදපිරි ප්‍රමාණය පුද කිරීමට කැමැත්තෙමු.

ශිරාණි වීරකෝන්
සාමාන්‍යාධිකාරී
කිතුල් සංවර්ධන මණ්ඩලය

## 03. අධ්‍යක්ෂ මණ්ඩලයේ සමාලෝචනය

මීට පෙර කිතුල් ආශ්‍රිත නිෂ්පාදන සහ විකුණුම් ප්‍රවර්ධනය කිරීම සඳහා කැප වූ ව්‍යවස්ථාපිත ආයතනයක් ශ්‍රී ලංකාවේ නොතිබූ අතර 2021 මාර්තු 17 වැනි දින අංක 2219/37 දරණ විශේෂ ගැසට් නිවේදනය මගින් ස්ථාපිත කරන ලද කිතුල් සංවර්ධන මණ්ඩලය කිතුල් ව්‍යවසායකයින්ගේ ප්‍රගමනය සඳහා විශේෂයෙන්ම නිර්මාණය කරන ලද පළමු සහ එකම ආයතනය වේ. දේශීය හා ජාත්‍යන්තර වශයෙන් කිතුල් නිෂ්පාදන සඳහා දැනට පවතින ඉල්ලුම ඉහළ නැංවීම තුළින් මෙරටට ගලා එන ආදායමට සැලකිය යුතු දායකත්වයක් ලබා දීම සඳහා කිතුල් කර්මාන්තයට හැකියාව පවතින බව අපි තරයේ විශ්වාස කරමු. අපගේ මෙම ඉලක්කය සාක්ෂාත් කර ගැනීම සඳහා ව්‍යවසායකයින්ගේ ශක්තිමත් දායකත්වයක් ලබා ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීමට අපේක්ෂා කරමු. දකුණු ආසියාතික රටවල් කිහිපයක කිතුල් ශාකය දක්නට ලැබුණද එහි දක්නට නොලැබෙන සුවිශේෂීත්වයක් ශ්‍රී ලංකාවේ පවතින කිතුල් ශාකයන්හි පවතින බව පර්යේෂකයන් විසින් පෙන්වා දී ඇත. එහි ඇති මෙම සුවිශේෂී ලක්ෂණය භාවිතා කරමින් නව අගය එකතු කරන ලද නිෂ්පාදන හරහා ජාත්‍යන්තර වෙළඳපොළට ප්‍රවිෂ්ඨ වීමේ ධනාත්මක ප්‍රවේශයක් ලබාගත හැකි බව අපි තරයේ විශ්වාස කරමු.

## 04. කිතුල් සංවර්ධන මණ්ඩලයේ සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය

I. ගිහාන් පෙරේරා මහතා (නීතිඥ) - සභාපති
II. ආචාර්ය රවීන්ද්‍ර කේ. විතානච්චි මහතා - සාමාජික
III. ආචාර්ය පී.රණසිංහ මහතා - සාමාජික
IV. උදය ප්‍රිමාල් ප්‍රනාන්දු මහතා - සාමාජික
V. පී. ඩී. එච් දාබරේ මිය - සාමාජික
VI. කේ.කේ.එස්.ආර්. දයාරත්න මිය - සාමාජික

| තනතුර | නම | දුරකථන අංකය | විද්‍යුත් තැපැල |
|---|---|---|---|
| සභාපති | ගිහාන් පෙරේරා (නීතිඥ) මහතා | 0774729108 | chairmankdb@gmail.com |
| සාමාජික | ආචාර්ය රවීන්ද්‍ර කේ විතානාච්චි මහතා | 0713567935 | raveendra@gmail.com<br>raveendra.pre@gmail.com |
| සාමාජික | ආචාර්ය පී.රණසිංහ මහතා | 0714434767 | pathmasiri@iti.lk<br>pathmasiriranasingha@yahoo.com |
| සාමාජික | උදය ප්‍රිමාල් ප්‍රනාන්දු මහතා | 0773530735 | Udaya.primal@yahoo.com |
| සාමාජික | පි.ඩී.එච් දාබරේ මහත්මිය | 0714488286 | dabaredharshani@yahoo.com |
| සාමාජික | ශිරන්ති දයාරත්න මහත්මිය | 0712174016 | Kkshiranthi81@yahoo.com |


## 05. විධායක කළමනාකරණ කණ්ඩායම

| තනතුරු | නම | දුරකථන අංකය | විද්‍යුත් තැපැල් ලිපිනය |
|---|---|---|---|
| සාමාන්‍යාධිකාරී | ශිරාණි වීරකෝන් මිය | 0777844001 | shirani101@gmail.com |
| කළමනාකරු | ඒ.එච්.එන්. චින්තක මයා | 0766995035 | ncaluthwalahewa@gmail.com |
| නියෝජ්‍ය කළමනාකරු (මූල්‍ය) | එස්.සී.එස්. ප්‍රනාන්දු මයා | 0714446503 | champika1980june@gmail.com |
| නියෝජ්‍ය කළමනාකරු (අලෙවි) | කේ.ඒ.ජී. දිල්රුක්ෂි මිය | 0714422305 | dilrukshi76@yahoo.com |

**06. ආයතනික තොරතුරු**

| | | |
|---|---|---|
| නම | : | කිතුල් සංවර්ධන මණ්ඩලය |
| නෛතික රාමුව | : | 2021 මාර්තු 17 වැනි දින අංක 2219/37 දරන විශේෂ ගැසට් නිවේදනය |
| ආරම්භක වර්ෂය | : | 2021 |
| ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය | : | අංක 239/1, කන්ද වත්ත පාර, පැලවත්ත, බත්තරමුල්ල. |
| දුරකථන අංකය | : | 0112784638 |
| විද්‍යුත් ලිපිනය | : | genkdb@gmail.com<br>chairmankdb@gmail.com |
| විගණන කටයුතු | : | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණක<br>විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව |
| නීති උපදේශක | : | නීතිපති දෙපාර්තමේන්තුව |
| බැංකුකරු | : | ලංකා බැංකුව |

6.1 සංවිධාන ව්‍යුහය


සභාපති/
අධ්‍යක්ෂ
මණ්ඩලය
සාමාන්‍යාධිකාරී
කළමනාකරු
(වැඩ බලන)
සහකාර/නියෝජ්‍ය
කළමනාකරු
(අලෙවි)
සහකාර/ නියෝජ්‍ය
කළමනාකරු
(පර්යේෂණ හා
සංවර්ධන)
සහකාර/නියෝජ්‍ය
කළමනාකරු
(මූල්‍ය)
සහකාර/නියෝජ්‍ය
කළමනාකරු
(පාලන)
අභ්‍යන්තර විගණක
පර්යේෂණ හා
සංවර්ධන නිලධාරි
ගිණුම් නිලධාරි
පරිපාලන නිලධාරි
පර්යේෂණ හා
සංවර්ධන සහකාර
කළමනාකරණ
සහකාර

## 6.2 ආයතනයේ අරමුණු

1. අපනයන සහ ආනයන කටයුතුවල දී මිල සහ තත්ත්ව ප්‍රමිතින් නියාමනය කිරීම.
2. කර්මාන්තයේ සුමට ක්‍රියාකාරිත්වයට අහිතකර ලෙස බලපාන දැනට පවතින නීති සහ රෙගුලාසි ප්‍රතිසංස්කරණය කිරීම.
3. වටිනාකම් දාම ප්‍රවේශය හරහා නිෂ්පාදනයන්ට සහාය වීම සඳහා මහා පරිමාණ, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ජාලගත කිරීම.
4. ව්‍යවසායකත්ව සංවර්ධනය හරහා සම්ප්‍රදායික කර්මාන්ත මානසිකත්වයේ සිට ව්‍යාපාරික මානසිකත්වය දක්වා සංස්කෘතික මාරුවක් ඇති කිරීම.
5. සමාජ සංවර්ධනය මඟින් ප්‍රජාවගේ සාමූහික සහභාගිත්වය සංවිධානය කිරීම.
6. තාක්ෂණය භාවිතයෙන් කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා නිසි වගා පිළිවෙත් සහ නිෂ්පාදන ක්‍රියාවලින් සමඟ කර්මාන්තය ප්‍රමිතිගත කිරීම.
7. ප්‍රචාරණය සහ ප්‍රවර්ධනය ශිල්පීය ක්‍රම හරහා නව වෙළඳපොළ වෙත ළඟා වීම
8. පවතින ආර්ථික අවස්ථා පිළිබඳ ව දැනුවත් කිරීම තුළින් කිතුල් නිෂ්පාදකයින් කර්මාන්තයේ රඳවා ගැනීම, තරුණ සහභාගිත්වය වැඩි කිරීම සහ ඔවුන්ගේ ආත්ම විශ්වාසය ගොඩ නැගීම.
9. වෙළඳපොළ සහ නිෂ්පාදන පදනම් කරගත් පර්යේෂණ මත පදනම්ව නව නිෂ්පාදන හඳුන්වා දීම.
10. කර්මාන්ත ප්‍රජාව අගය කිරීම සඳහා ක්‍රමානුකූලව ප්‍රතිලාභ යාන්ත්‍රණය සංවර්ධනය කිරීම.
11. කිතුල් වගාව ව්‍යාප්ත කිරීම මඟින් හරිතාගාර ආවරණය අඩු කිරීම.
12. කාන්තාවන් අගය එකතු කළ නිෂ්පාදනය වෙත යොමු කිරීමෙන් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ප්‍රවර්ධනය කිරීම.
13. සුදුසු අතුරු බෝග හඳුනා ගැනීමෙන් කිතුල් ශාකය සහිත ඉඩම් වල ඵලදායිතාව වර්ධනය කිරීම.



**රූපය 1 :- කිතුල් මැදීමේ ක්‍රියාවලිය**

## 6.3 ආයතනයේ බලතල

1. ලියාපදිංචිය,
   - A. කිතුල් වතු සහ එම වතුවල හිමිකරුවන්
   - B. කිතුල් නිෂ්පාදකයින්
   - C. කිතුල් නිෂ්පාදන මිල දී ගැනීමේ සහ විකිණීමේ නිරත වෙන්දේසිකරුවන් සහ තැරැව්කරුවන්
   - D. කිතුල් නිෂ්පාදන නැව්ගත කරන්නන්

2. එවැනි යම් ලියාපදිංචියක් සඳහා තිබිය යුතු සුදුසුකම්, නියමයන් සහ කොන්දේසි, ක්‍රියා පටිපාටිය සහ වාර්ෂික ගාස්තු එහි අභිමතය පරිදි යම් නමක් ලියාපදිංචියෙන් ඉවත් කිරීම හෝ නැවත ඇතුළත් කිරීම පිළිබඳව තීරණය කිරීම.

3. කිතුල් වගාවක් සිදුකරනු ලබන ඉඩම් ප්‍රයෝජනයට ගැනීම සහ ඒවා වගා කිරීමෙහි සහ එම ඉඩම්වල කිතුල් වගා කිරීමෙහි නියැලීම, විධිමත් කිරීම, පාලනය කිරීම, අධීක්ෂණය කිරීම, මෙහෙයවීම, කළමනාකරණය කිරීම සහ පරීක්ෂා කිරීම.

4. කිතුල් නිෂ්පාදන නිපදවීම, ඇසුරුම් කිරීම, ගබඩා කිරීම, ප්‍රවාහනය සහ විකිණීම නියාමනය, පාලනය, අධීක්ෂණය, මෙහෙයවීම, කළමනාකරණය සහ පරීක්ෂා කිරීමෙහි නිරත වීම.

5. කර්මාන්තශාලා, ගබඩා, අංගන, ගොඩනැගිලි පරීක්ෂා කිරීම, අධීක්ෂණය කිරීම, නියාමනය කිරීම, සහ පාලනය කිරීම, පරිශ්‍ර, උපකරණ හා යන්ත්‍රෝපකරණ නිෂ්පාදකයා සඳහා භාවිතා කරන හෝ භාවිතා කිරීමට කිතුල් නිෂ්පාදන ඇසුරුම් කිරීම හෝ ගබඩා කිරීම.

6. කිතුල් නිෂ්පාදන මිල දී ගැනීම නියාමනය කිරීම, පාලනය කිරීම, අධීක්ෂණය කිරීම, මඟපෙන්වීම, කළමනාකරණය කිරීම, සහ පරීක්ෂා කිරීම සඳහා, විකිණීමට කිතුල් නිෂ්පාදන ප්‍රවාහනය, ගබඩා කිරීම, ආනයනය සහ අපනයනය කිරීම.

7. කිතුල් නිෂ්පාදන මිල දී ගැනීම සහ විකිණීම සඳහා අලෙවි කාමර පිහිටුවීම හා එවැනි අලෙවි කාමරවල කාර්ය පටිපාටිය තීරණය කිරීම, සහ අලෙවි කාමරවල විකුණනු ලබන යම් නිෂ්පාදනයක් බාරදීම හා ඒ සඳහා කාර්ය පටිපාටිය තීරණය කිරීම

8. කිතුල් නිෂ්පාදන අපනයනය සඳහා බලපත්‍රයක් නිකුත් කිරීම සහ එවැනි බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා වන සුදුසුකම්, නියමයන්, කොන්දේසි, ක්‍රියා පටිපාටිය, සහ එහි අභිමතය පරිදි යම් තැනැත්තෙකුට බලපත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම හෝ දැනටමත් නිකුත් කරන ලද බලපත්‍රයක් අවලංගු කිරීම පිළිබඳ තීරණය කිරීම.

## 6.4 ප්‍රධාන කාර්යයන්

1. කිතුල් වගාවන් සිදු කරනු ලබන ඉඩම්වල ඵලදායිතාව සංවර්ධනය කිරිම හා සංවර්ධනය කිරීම සඳහා සහාය දීම.
2. ඉඩම්වල කිතුල් වගා කිරීම හා කිතුල් වගාව සඳහා ආධාර කිරීම, ප්‍රවර්ධනය සහ නියාමනය
3. තෘණ ඇතුළු අනෙකුත් බෝග සමඟ වගා කිරීමට සුදුසු කිතුල් ඉඩම් හඳුනා ගැනීම සහ එම ඉඩම්වල අන්තර් බෝග රෝපණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා ප්‍රවර්ධනය, මෙහෙයවීම, ක්‍රියාත්මක කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා සහාය වීම.
4. කිතුල් වගාවන් සිදු කරනු ලබන ඉඩම්වල සත්ත්ව පාලනය සිදු කිරීම සහ සත්ව පාලනයේ නියැලීම ප්‍රවර්ධනය කිරීම සහ විධිමත් කිරීම සඳහා සහාය දීම.
5. කිතුල් වගාවන්වල කිතුල් සහ අනෙකුත් භෝග වගා කිරීම සම්බන්ධයෙන් නිසි වගා කිරීමේ ව්‍යවහාරයන් පිළිබඳ නිශ්චය කිරීම, ප්‍රචලිත කිරීම, ප්‍රවර්ධනය සහ මෙහෙයවීම.
6. කිතුල් නිෂ්පාදන නිපදවීම හා ඒ පිළිබඳ සහය ලබාදීම සහ ප්‍රවර්ධනය සහ විධිමත් කිරීම.
7. කිතුල් නිෂ්පාදන සැකසීමේ නව තාක්ෂණික ක්‍රම ප්‍රවර්ධනය.
8. කිතුල් නිෂ්පාදන නිපදවන ආයතනවල කාර්යක්ෂමතාව වැඩි කිරීමට සහය වීම සඳහා සහාය ලබා දීම හා ඒවා නවීකරණය කිරීම ප්‍රවර්ධනය කිරීම හා මෙහෙයවීම.
9. ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කරනු ලබන හෝ අපනයනය කරනු ලබන කිතුල් නිෂ්පාදනවල ගුණාත්මක තත්ත්වයන් පිළිබඳ ප්‍රමිති නියම කිරීම සහ පවත්වාගෙන යාම.
10. සාමාන්‍යයෙන් කිතුල් නිෂ්පාදන සඳහා අවම සහ උපරිම මිල යෝජනා ක්‍රම සහ මිල ස්ථායීකරණ යෝජනා ක්‍රම සැකසීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා කිතුල් නිෂ්පාදන මිල දී ගැනීම, විකිණීම, නියාමනය කිරීම, ක්‍රියාත්මක කිරීම, හෝ සහය වීම.
11. කිතුල් නිෂ්පාදනවල අපනයන සහ ආනයන මිල නියාමනය කිරීම.
12. ප්‍රවර්ධන වැඩසටහන් මඟින් ශ්‍රී ලංකාව තුළ සහ ඉන් පිටත කිතුල් නිෂ්පාදන සඳහා ඉල්ලුමක් ඇතිකිරීම හා අලෙවි ප්‍රදර්ශන සඳහා යොමු කිරීම.
13. කිතුල් නිෂ්පාදන ශ්‍රී ලංකාව තුළ සහ ඉන් පිටත ප්‍රවාහනය සහ අලෙවියට අදාළ සියලු ම අංශ සඳහා වෙළඳපළ පර්යේෂණ පැවැත්වීම.
14. කිතුල් ගස්වල වර්ධනය හා වගාව, අනෙකුත් භෝග වගා කිරීම සහ කිතුල් වතු ආශ්‍රිතව සත්ත්ව පාලනයේ නියැලීම, රෝග හා පළිබෝධ වැළැක්වීම සහ සුව කිරීම සම්බන්ධයෙන් විද්‍යාත්මක පර්යේෂණ පැවැත්වීම සහ ඉදිරියට ගෙන යාම.
15. පර්යේෂණ ආයතන, පර්යේෂණාත්මක ස්ථාන සහ තවාන් පිහිටුවීම සහ නඩත්තු කිරීම.
16. කිතුල් නිෂ්පාදන සැකසීම සහ භාවිතය සම්බන්ධයෙන් විද්‍යාත්මක පර්යේෂණ පැවැත්වීම සහ ඉදිරියට ගෙනයාම.
17. කිතුල් නිෂ්පාදන සකස්කිරීම සඳහා නියමු පිරියත පිහිටුවීම, පවත්වාගෙන යාම, සහ අත්හදාබැලීමේ සැකසුම් උපකරණ සැකසීම.
18. කිතුල් කර්මාන්තයට සහය වීම සඳහා උපදේශන හා ව්‍යාප්ති සේවකයන් පුහුණු කිරීම.
19. තාක්ෂණික ස්වභාවයේ සියලු කාරණා සම්බන්ධයෙන් කිතුල් කර්මාන්තයට මඟ පෙන්වීම සහ උපදෙස් දීම.
20. කිතුල් වතුවල හෝ කිතුල් නිෂ්පාදන නිෂ්පාදනය කරන හෝ වෙළදාම් කරන ආයතවල කළමනාකරණය සහ හිමිකාරිත්වය පිළිබඳ සමුපකාර සහ සාමූහික ආකෘති ප්‍රවර්ධනය කිරීම.

## 6.5 ආයතනික පාලනය

ගරු වෛද්‍ය රමේෂ් පතිරණ අමාත්‍යතුමාගේ මූලිකත්වයෙන් පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදනය හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ආරම්භක ප්‍රාග්ධනය ලෙස රුපියල් මිලියන 50ක් වෙන් කරමින් කිතුල් කර්මාන්තයේ සංවර්ධනය උදෙසා පොල් සංවර්ධන පනත යටතේ 2021.03.17 දිනැති විශේෂ ගැසට් අංක 2219 - 37 මඟින් කිතුල් සංවර්ධන මණ්ඩලය ස්ථාපනය කර ඇත. දිවයිනේ ග්‍රාමීය ප්‍රදේශ වල ස්ථාපිත වූ ඓතිහාසික කර්මාන්තයක් වන කිතුල් කර්මාන්තය ගෘහාශ්‍රිත කිතුල් කර්මාන්තයක් වශයෙන් ආරක්ෂා කිරීමට ප්‍රමුඛත්වයක් ලබා දෙමින් ජාතික කිතුල් සංවර්ධන වැඩසටහනක් මෙම මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරමින් සිටී. කිතුල් සංවර්ධන මණ්ඩලයේ සංයුතිය ලෙස සභාපති ගිහාන් පෙරේරා මහතාගේ ප්‍රධානත්වයෙන් නිල බලයෙන් වැව්ලි

අමාත්‍යාංශය, මුදල් අමාත්‍යාංශය සහ කාර්මික තාක්ෂණ ආයතනය (ITI) නියෝජනය කරමින් සාමාජිකයින් තිදෙනෙකු පත් කර ඇත.

කිතුල් සංවර්ධන මණ්ඩලය, කිතුල් කර්මාන්තයේ නියැලී සිටින ජනතාවගේ ජීවනෝපාය වැඩි දියුණු කිරීම සහ නව තාක්ෂණය සහ වෙනත් ක්‍රම මඟින් දේශීය අපනයන ඉපැයීම් දියුණු කිරීම අරමුණු කරයි. දැනට පවතින දත්තවලට අනුව දැනට මෙම අංශයේ 300,000ත් 500,000ත් අතර පිරිසක් නියැලී සිටින අතර ඇතැම් ව්‍යවසායකයින් දේශීය නිෂ්පාදන වලින් ඔබ්බට ගොස් ජාත්‍යන්තර වෙළඳපොළටද කිතුල් නිෂ්පාදන අපනයනය කරයි.



**රූපය 2 :- කිතුල් මල**

## 07. වත්මන් සම්පත්

### 7.1 ඓතිහාසික වටිනාකම්

උද්භිද විද්‍යාත්මකව *Caryota urens* ලෙස හඳුන්වන, දැනට විශේෂයෙන් ආහාර නිෂ්පාදනයට උපයෝගී කර ගන්නා කිතුල් ශාකයට වසර 2000කට වැඩි ඉතිහාසයක් ඇත. විදේශිකයන්ගේ සංක්‍රාන්තිය සමඟ තේ, කෝපි පානය ආරම්භ වීමට පෙර ශ්‍රී ලාංකිකයා රණවරා, පොල් පලා ආදී ඖෂධීය පානයන් හකුරු සමඟ පානය කිරීමට පුරුදු වී සිට ඇති බවට මත පළ වේ. එසේම කිතුල් හකුරු සහ පැණි අතීතයේ සිට කැවිලි වර්ග සෑදීමට භාවිතා කර ඇත. නැවුම් කිතුල් තෙලිදිය සෞඛ්‍යමය පානයක් ලෙස ද භාවිතා කිරීම ගැමි ජනතාව අතර අතීතයේ සිට ජනප්‍රිය කරුණකි.

කිතුල් කර්මාන්තය ආරම්භ වූ වකවානුව පිළිබඳව පැහැදිලි දත්ත නොමැති නමුත් බුදුන්වහන්සේගේ කාලයේදී ද තිබූ බවටද සාක්ෂි ඇත. බෞද්ධ සාහිත්‍යයට අනුව බුදුන්වහන්සේ හිමාල වනයේ වඩින විට පිපාසයක් දැනී ඇති අතර මේ බව දිවැසින් දුටු ශක්‍ර දෙවිඳුන් ලේනකු වේසයක් මවාගෙන කිතුල් ගසක මලක් කපා උන්වහන්සේගේ පාත්‍රය පිරී ඉතිරී යාමට සැලැස්වූ බව ද සඳහන්ය. කිතුල් සම්බන්ධ මන්ත්‍රවල ද මේ බව සඳහන්ව ඇත. කුම්භ ජාතක අටුවාව හා ශබ්ධ නීතිය වැනි පැරණි පොත පතෙහි කිතුල් පිළිබඳ සඳහන් වීම ඊට සාක්ෂි වශයෙන් සැලකිය හැකිය. පාලි භාෂාවෙන් "හින්තාල" යනුවෙන් හඳුන්වන්නේ කිතුල් ශාකයයි.

එසේම කිතුල් යනුවෙන් බෞද්ධ සාහිත්‍යයේදී හඳුන්වනු ලබන්නේද කිතුල් ශාකයයි. ලැබී ඇති සාක්ෂි වලට අනුව ක්‍රි.පූ. 116 ට අයත් කාලයේ කිතුල් ශාකය තිබූ බව සඳහන් වේ. පෙර රජුන් දවස යුද්ධයක් ජයග්‍රහණය කල පසු එය සැමරීමට කිතුල් පත්‍ර පැළඳූ බව සඳහන්ය. මහා පරාක්‍රමබාහු රජුගේ උයන් වතුවල කිතුල් ශාකය තිබූ බවද සඳහන් වේ.

## 7.2 වත්මන් අගයන්

වර්තමානයේදී ශ්‍රී ලංකාව සංවර්ධනය කරා යන ගමනේදී නාගරික සංවර්ධනයට මෙන්ම වැඩි අවධානයක් ග්‍රාමීය සංවර්ධනය සඳහා ද යොමු කර ඇත. කිතුල් කර්මාන්තය යනු ග්‍රාමීයව සංවර්ධනය කල හැකි කර්මාන්තයක් වන අතර ඉන් ග්‍රාමීය ප්‍රජාවගේ ජීවන මට්ටම ඉහළ නැංවීමට හැකියාවක් ඇති බව පසුගිය කාලයේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්වලින් ලද අත්දැකීම් වලින් සනාථ වී තිබේ. එහෙත් කිතුල් කර්මාන්තයේ වර්තමානය සලකා බලන විට යම්කිසි දියුණුවක් ලද ග්‍රාමීය කර්මාන්තයක් ලෙස හෝ ස්වයං රැකියාවක් ලෙස හෝ පුළුල් ව්‍යාප්ත වීමක් දක්නට නොලැබේ. විශේෂයෙන් කිතුල් කර්මාන්තය දියුණු කිරීමට වරින්වර විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කර තිබුණද දිගුකාලීනව සහ තිරසාරව ක්‍රියාත්මක කිරීමට ගෙන ඇති උත්සහය ප්‍රායෝගික තලයේදී ප්‍රමාණවත් දායකත්වයක් සපයා නැත.



**රූපය 3 :- කපන ලද කිතුල් මලක්**

විවිධ වැඩසටහන් මඟින් තාක්ෂණය දැනුම ලබාදුන්න ද ඒ පිළිබඳව පසු විපරමක් නොවීම හේතුවෙන් කිතුල් ගොවීන් නාමිකව වැඩසටහන්වලට සම්බන්ධ වී තිබූ අතර එම දැනුම තම කර්මාන්තයේ උන්නතිය සඳහා භාවිතයට ගෙන ඇත. කිතුල් කර්මාන්තයේ උන්නතිය උදෙසා රජය මඟින් නීතිමය තත්ත්වයන් ලිහිල් කර තිබුණද එය ප්‍රායෝගික මට්ටමේදී ක්‍රියාත්මක නොවීම හේතුවෙන් කිතුල් කාර්මිකයන් මෙම කර්මාන්තයෙන් ඈත්වීමක් සිදු වී ඇත. කිතුල් කර්මාන්තය දියුණු කිරීම උදෙසා පසුගිය කාලයේ වරින්වර අවධානයක් යොමු වී තිබුණත් එය සිදු වී තිබුණේ සාම්ප්‍රදායික ක්‍රමයට අමාත්‍යාංශයක එක් වැඩසටහනක් බවට පත් කරමිනි.

ග්‍රාමීය කර්මාන්තයක් වශයෙන් තිබෙන මෙම ක්ෂේත්‍රය ඉන් ඔබ්බට ගෙනවිත් ව්‍යවසායකත්ව දැනුම තුළින් බල ගැන්වූ ව්‍යාපාරයක් බවට පත් කිරීමේ අවශ්‍යතාවය මැනවින් වටහා ගත් නිසාවෙන්ම කිතුල් කර්මාන්තයේ දියුණුව උදෙසා කටයුතු කිරීමට වෙනම ආයතනයක් ලෙස කිතුල් සංවර්ධන මණ්ඩලය පිහිටුවීම කිතුල් කර්මාන්තයේ නව ඇරඹුමක් සනිටුහන් කිරීමක් ලෙස හැඳින්විය හැක.

## 7.3 පවතින ශක්තීන්, දුර්වලතා, අවස්ථා සහ තර්ජන

කිතුල් කර්මාන්තය ජාතික ආදායමට සහ ග්‍රාමීය ආර්ථික සංවර්ධනයට දායක විය හැකි කර්මාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම මෙම මණ්ඩලයේ ප්‍රධාන අරමුණ වේ. එහිදී කිතුල් කර්මාන්තයට ඍජුවම සම්බන්ධවූවන්ගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම සඳහා කිතුල් කර්මාන්තයට අදාළ ව්‍යාපාර ව්‍යාප්ත කිරීමට අවස්ථාව ලබාදීම සිදු කරනු ලැබේ. විශේෂයෙන්ම පරිසර හිතකාමී අංශයක් ලෙස කිතුල් කර්මාන්තය ශ්‍රී ලංකාවට අනන්‍ය වූවක් නිසා කිතුල් සංවර්ධන මණ්ඩලයේ මූලික කාර්යය වූයේ එය රටේ අනන්‍යතාව පිළිබිඹු කරන, තිරසාර පැවැත්ම තහවුරු කරන දේශීය කර්මාන්තයක් ලෙස දියුණු කිරීමට අවශ්‍ය කෙටි කාලීන හා දිගු කාලීන උපාය මාර්ග හඳුනා ගැනීමයි. කිතුල් සංවර්ධන මණ්ඩලය ආයතනයක් ලෙස පිහිටුවීමේ දී කිතුල් කර්මාන්තය පිළිබඳ විශ්ලේෂණයක් සිදු කිරීමට 2022 ජනවාරි මස පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ගන්නා ලද තීරණයක ප්‍රතිඵලයක් වශයෙන්, එහි ශක්තීන්, දුර්වලතා, අවස්ථා සහ තර්ජන තක්සේරු කිරීම සඳහා පහත පරිදි විශ්ලේෂණයක් සිදු කරන ලදි.

**1. ශක්තීන්**

I. නිෂ්පාදනවල අනන්‍ය සහ අව්‍යාජ වටිනාකම්
II. සාම්ප්‍රදායික ක්‍රම භාවිතය
III. ශ්‍රී ලංකාව පුරා පුළුල් ව්‍යාප්තිය
IV. වෙළඳපොළ විභවය
V. හිතකර සෞඛ්‍ය තත්ත්වය/පෝෂණ සංඝටක අඩංගු වීම
VI. අර්ධ කාලීන රැකියා අවස්ථා
VII. විවිධාංගීකරණ නිෂ්පාදන හැකියාව
VIII. පරිසර හිතකාමී බව

**2. දුර්වලතා**

I. තාක්ෂණික ක්‍රම භාවිතයේ සීමා
II. අවම සමාජ පිළිගැනීම
III. කාබනික වගාවක් ලෙස ප්‍රචලිත නොවීම
IV. අදාළ ආයතන අතර දුර්වල සම්බන්ධීකරණය
V. වෘත්තීය සම්බන්ධව ඇති අවදානම
VI. පර්යේෂණ සහ සංවර්ධන දුර්වලතා

**3. අවස්ථාවන්**

I. රජයේ මැදිහත් වීම සහ කිතුල් කර්මාන්තය දියුණු කිරීමට කිතුල් සංවර්ධන මණ්ඩලය පිහිටුවීම
II. සෞඛ්‍ය  උපයෝගීතා පැවතීම
III. අගය එකතු කළ කර්මාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීමේ හැකියාව
IV. විවිධ අංශ සමඟ ඒකාබද්ධ විම (ආයුර්වේදය, අත්කම්, බලශක්ති වැනි)
V. සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් සඳහා මහජන උනන්දුව වර්ධනය වීම
VI. ලෝක ප්‍රසිද්ධ මේපල් පැණිවලට සමාන කිරීමේ හැකියාව
VII. ස්වයං රැකියා අවස්ථා බහුල වීම
VIII. විදේශ වෙළඳපළට ප්‍රවේශ වීමේ හැකියාව

**4.තර්ජන**

I. නාගරීකරණය.
II. ආදේශක සහ තරඟකාරී භාණ්ඩ.
III. ස්වාභාවික කිතුල් අමුද්‍රව්‍ය භාවිතයෙන් නිෂ්පාදනය කරනු ලබන ව්‍යාජ නිෂ්පාදන වල ඉහළ යාමේ ප්‍රවණතාව
IV. කිතුල් කර්මාන්තයක් ලෙස හඳුන්වාදීමේ දී පවතින අනාරක්ෂිත භාවය.
V. තරුණයින් ආකර්ෂණය නොවීම සහ ඔවුන් කර්මාන්තයෙන් ඉවත් වීම.
VI. අවම සමාජ පිළිගැනීම.
VII. කිතුල් වගාවට ගතවන කාලය.

## 7.4 විශේෂ ව්‍යාපෘතිවල ප්‍රගතිය (2022.12.31 දිනට)

අයවැය කථාව මගින් ලැබෙන සෘජු ප්‍රතිපාදනවල මූල්‍ය හා භෞතික ප්‍රගතිය.

**වගුව 1 :- විශේෂ ව්‍යාපෘතිවල ප්‍රගතිය (2022.12.31 දිනට)**

| ව්‍යාපෘතිය | අනුමත කළ වෙන් කිරීම (රු.මිලියන) | මූල්‍යමය ප්‍රගතිය (රු.මිලියන) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| ක්‍රියාත්මක කරන ආයතනය - කිතුල් සංවර්ධන මණ්ඩලය | | | |
| 2021 වර්ෂය තුළ රාජ්‍ය අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතිවලට අදාළ බිල්පත් පියවීම. හිඟ බිල් පත් ගෙවා ඇත. | 44.34 | 44.34 | ▪ හිඟ බිල්පත් පියවා ඇත. |
| කිතුල් සංවර්ධන මණ්ඩලය නිල වශයෙන් ආරම්භ කිරීම. | 4.20 | 4.12 | ▪ සම්පූර්ණයි. |
| අනාගත අභියෝගකරුවන් සහ ඉල්ලීම් සැලකිල්ලට ගනිමින් කිතුල් අංශයේ කළමනාකරණ තත්ත්වය යාවත්කාලීන කිරීම. | 0.17 | 0.15 | ▪ කිතුල් අංශයේ ඉදිරි ගමන සහ උපාය මාර්ගික සැලැස්ම සකස් කිරීම 100% ක් අවසන් කිරීම. |
| කිතුල් ගොවි සමිති ඒකරාශි කිරීම හා සවිබල ගැන්වීම. | 3.80 | 1.83 | ▪ ගාල්ල සහ මහනුවර දිස්ත්‍රික්ක වල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 21ක කිතුල් කර්මාන්තයේ නියැලෙන ජනතාව ඒකරාශි කරගනිමින් කිතුල් කර්මාන්තයේ උන්නතිය සඳහා දිස්ත්‍රික් මට්ටමින් ප්‍රජා මූලික සමිති පිහිටුවීම.<br>▪ නෙළුව හා තවලම යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දෙකෙහි හඳුනාගත් ව්‍යවසායකයින් සියයකට අධික සංඛ්‍යාවකගේ සහභාගිත්වයෙන් ප්‍රජා මූලික යාන්ත්‍රනයක් ක්‍රියාත්මක කිරීම. |
| කිතුල් නිෂ්පාදකයින් අනන්‍යතාවයක් ලබාදීම සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීම සහ ජීවිත රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දීම. | 2.00 | - | ▪ ලැබුණු අක්මුදල් ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා ප්‍රමාණවත් නොවීය. |
| විදේශ කටයුතු අමාත්‍යාංශය සහ වාණිජ දෙපාර්තමේන්තුව එක්ව ශ්‍රී ලංකා තනාපති කාර්යාල හරහා ජාත්‍යන්තර වෙළඳපොළ ප්‍රවර්ධනය කිරීම සඳහා කිතුල් නිෂ්පාදන සහ නිෂ්පාදකයින්ගේ විස්තර ඇතුළත් පුස්කොළ පොතක් සකස් කිරීම. | 2.50 | - | ▪ එය අංක 3/2022 දරන චක්‍රලේඛ ප්‍රකාරව ක්‍රියාත්මක නොවීය. |

| | | | |
|---|---|---|---|
| කිතුල් ව්‍යවසායකයින් 20 කට ජාත්‍යන්තර වෙළඳපොළ සඳහා අදාළ තාක්ෂණය හා නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීමට GMP සහ SLSI සහතික පත්‍ර ලබා ගැනීම සඳහා මූල්‍ය ආධාර ලබා දීම. | 3.00 | - | ▪ කිතුල් ව්‍යවසායකයින් 8 දෙනෙකුට GMP සහතික ප්‍රදානය කිරීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීම.<br>▪ කිතුල් පැණි සහ හකුරු ක්‍රියාවලිය සඳහා පිළිවෙත් සංග්‍රහයක් සකස් කරන ලෙස ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයට දැනුම් දී ඇත. |
| බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි ජාත්‍යන්තර මට්ටමේ කිතුල් අලෙවි මධ්‍යස්ථානයක් පිහිටුවීම. | 5.00 | - | ▪ එය අංක 3/2022 චක්‍ර ලේඛයට අනුව ක්‍රියාත්මක නොවීය. |
| කිතුල් මදින්නන් සඳහා ආරක්ෂිත කට්ටල ලබා දීම.<br>• හිසේ පළඳින ආරෝපණය කළ හැකි විදුලි පන්දම්<br>• තොප්පි<br>• වැහිකබා<br>• බාල්දි<br>• ආරක්ෂිත සපත්තු | 0.20 | 0.17 | ▪ ප්‍රතිලාභීන් සඳහා උපකරණ ලබා දෙන ලදි. |
| කිතුල් සංවර්ධන මණ්ඩලය සඳහා ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් | 24.66 | 11.63 | ▪ වියදම් මත පදනම් ව මාසික අක්මුදල් වෙන් කරනු ලැබේ. |

### 7.5 කිතුල් හකුරු සහ පැණි අපනයනය



රූපය 4 :- කිතුල් හකුරු




රූපය 5 :- කිතුල් පැණි

| කිතුල් නිෂ්පාදන අපනයන පරිමාව (කි.ග්‍රෑ.) | | | | | |
|---|---|---|---|---|---|
| | **2018** | **2019** | **2020** | **2021** | **2022** |
| හකුරු | 157,909 | 126,369 | 219,285 | 248,915 | 190,585 |
| පැණි | 93,162 | 60,221 | 109,024 | 150,219 | 68,323 |
| එකතුව | 251,071 | 186,590 | 328,309 | 399,134 | 258,908 |


වගුව 2 :- කිතුල් නිෂ්පාදනවල අපනයන පරිමාව (කි.ග්‍රෑ)

| කිතුල් නිෂ්පාදන අපනයන අගය (රු. මි.) | | | | | |
|---|---|---|---|---|---|
| | **2018** | **2019** | **2020** | **2021** | **2022** |
| හකුරු | 63.61 | 55.00 | 103.90 | 150.02 | 158.44 |
| පැණි | 62.06 | 38.95 | 70.80 | 106.09 | 84.42 |
| එකතුව | 125.67 | 93.95 | 174.70 | 256.11 | 242.86 |

වගුව 3 :- කිතුල් නිෂ්පාදනවල අපනයන අගය (රු.මි.)




ප්‍රස්ථාර 1 :- 2018 – 2022 දක්වා කිතුල් නිෂ්පාදන අපනයන පරිමාව





ප්‍රස්ථාර *2* :- කිතුල් නිෂ්පාදනවල අපනයන අගය (රු.මි.)

*මූලාශ්‍රය: අපනයන සංවර්ධන මණ්ඩලය*

| අපනයන ආදායම් ඉලක්ක (රු. මි.) | | | | |
|---|---|---|---|---|
| | **2022** | **2023** | **2024** | **2025** |
| වාර්ෂික ආදායම | 200 | 400 | 450 | 500 |

**වගුව 4 :- අපනයන ආදායම් ඉලක්ක (රු.මි.)**




**ප්‍රස්ථාර 3 : වාර්ෂික අපනයන ආදායම**

*මූලාශ්‍රය: කිතුල් සංවර්ධන මණ්ඩලය*

## 08. කිතුල් සංවර්ධන මණ්ඩලය විසින් 2022 වර්ෂයේදි නිම කරන ලද ව්‍යාපෘති

### 8.1 උපාය මාර්ගික සැලැස්මක් සැකසීම.

කිතුල් සංවර්ධන මණ්ඩලය 2021 වර්ෂයේදි ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස ස්ථාපිත කරන ලදි. එය පිහිටුවීමට පෙර වතුකරය සම්බන්ධ විවිධ අමාත්‍යාංශ සහ රාජ්‍ය ආයතන කිතුල් ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය කිරීම හා සංවර්ධනය කිරීම සඳහා මුල පිරීම් සිදු කරන ලදී.

එම කාලයේ රජය විසින් කිතුල් සංවර්ධන මණ්ඩලයේ තත්ත්වය ඉහළ දමමින් ව්‍යවස්ථාපිත ආයතනයක් සහ පොල් ,කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය සහ අපනයන විවිධාංගීකරණය පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශයේ අනුබද්ධ ආයතනයක් බවට පත් කරමින් අලුතින් පිහිටවන ලදී. රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ඉදිරි වසර තුන සඳහා කිතුල් සංවර්ධන මණ්ඩලය සිය මෙහෙයුම් මෙහෙයවීම සඳහා පුළුල් ක්‍රියාකාරි සැලැස්මක් නිර්මාණය කිරීමේ වැදගත්කම හඳුනා ගෙන ඇත.

සම්පත්දායකයින්ගේ සහයෝගය, ඔවුන්ගේ සහයෝගිතාවෙන් හා සහභාගිත්වයෙන් මෙම ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරීමේ වැඩමුළුවක් පැවැත්වීමට කටයුතු සංවිධානය කෙරුණි. මෙම වැඩමුළුව 2022 ජනවාරි මස 13 වැනි දින ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ දී පැවැත්විණි. විවිධ ආයතන සහ සංවිධානවල ගෞරවනීය විද්වතුන්, විශේෂඥයින් සහ පාර්ශවකරුවන්, කාර්මික තාක්ෂණික ආයතනය ඇතුළුව, අපනයන සංවර්ධන මණ්ඩලය, සබරගමුව විශ්ව විද්‍යාලය, ජාතික ශිල්ප සභාව සහ කිතුල් අංශයේ ව්‍යවසායකයින්ට ක්‍රියාකාරී සැලැස්ම සැකසීමට සක්‍රියව දායක වන ලෙස ආරාධනා කරන ලදි.

කිතුල් සංවර්ධන මණ්ඩලය සඳහා ශක්තිමත් සහ උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම සඳහා සහභාගිවන්නන්ගේ දැනුම, ප්‍රවීණත්වය සහ තීක්ෂණ බුද්ධිය උපයෝගී කර ගැනීම මෙම වැඩමුළුවේ අරමුණ විය. විවිධ විද්වතුන්, ප්‍රවීණයන් පිරිසක් ඒකරාශි කිරීම සහ කර්මාන්ත නියෝජිතයන්ගේ සහයෝගිතාව වැඩි දියුණු කිරීම සඳහා වැඩමුළුව ඉලක්ක කර ඇත. වැඩමුළුව සඳහා සහභාගිවූවන් ඔවුන්ගේ අත්දැකීම ඉදිරි දර්ශන, සහ කිතුල් කර්මාන්තයේ දියුණුව හා ප්‍රවර්ධනය සම්බන්ධ අදහස් බෙදා ගන්නා ලදි.

සම්පත්දායකයින් වටිනා දායකත්වයක් සහ මග පෙන්වීමක් ලබා දුන්හ. ක්‍රියාකාරී සැලැස්ම හැඩ ගැන්වීම සඳහා ඔවුන්ගේ ප්‍රවීණත්වය සහ පර්යේෂණ සොයා ගැනීම් මත පදනම්ව, වැඩමුළුව අන්තර්ක්‍රියාකාරී සැසි සඳහා වේදිකාවක් සැපයීය. සාමූහික ගැටළු විසඳීම් සහ කණ්ඩායම් සාකච්ඡා, සියලුම සහභාගිවන්නන්ගේ ක්‍රියාකාරී සහභාගිත්වය සහතික කිරීම එම සහභාගිවන්නන්ගේ වටිනා අදහස් සහ යෝජනා ඉදිරිපත් කිරීමට ඉඩ ලබා දෙන ලදී. වැඩමුළුවේ ප්‍රතිඵලයක් ලෙස කිතුල් සංවර්ධන මණ්ඩලය ඉදිරි වසර තුන සඳහා මනාව නිර්වචනය කරන ලද ක්‍රියාකාරී සැලැස්මක් සාර්ථකව සකස් කරන ලදී. මෙම විස්තීර්ණ සැලැස්මට පැහැදිලි අරමුණු ඇතුළත් විය.

මෙම වැඩමුළුවේ දී කිතුල් කර්මාන්තයේ ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන (SWOT) පිළිබඳ විශ්ලේෂණය උපයෝගී කර ගැනීම සහ එහි ප්‍රතිඵල කිතුල් කාර්මික ශිල්පීන්ගේ සහ එම කර්මාන්තයට වගකිව යුතු රාජ්‍ය සංවිධානයේ අනාගත දියුණුව සඳහා යොදා ගත හැකි අකාරය පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරන ලදි. සහභාගිවන්නන්ට SWOT විශ්ලේෂණයේ විවිධ අංගයන් සක්‍රියව සාකච්ඡා කරන ලද අතර, කිතුල් සන්දර්භය තුළ එහි ප්‍රායෝගික භාවිතය පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා ගැනීමට අවකාශ ලබා දී ඇත. මෙම විශ්ලේෂණය මත ගොඩ නැගීම, සොයා ගැනීම් කරන අකාරය වටා සාකච්ඡා කෙරුණි.

ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන (SWOT) පිළිබඳ විශ්ලේෂණය කිතුල් කාර්මික ශිල්පීන්ගේ හැකියාවන් වර්ධනය කිරීමට සහ කර්මාන්ත අධීක්ෂණය සඳහා වගකිවයුතු සංවිධානයේ ක්‍රියාකාරිත්වය වැඩි දියුණු කිරීමට යොදා ගැනීම මෙම වැඩසටහනේ පරමාර්ථය විය.

වැඩමුළුවට සහභාගිවූවන්ගේ ශක්තීන් හඳුනා ගැනීමෙන් කිතුල් නිෂ්පාදනවල පෝෂණ ප්‍රතිලාභ ප්‍රවර්ධනය කිරීම හෝ අපනයන වෙළඳපළ පුළුල් කිරීම වැනි ප්‍රයෝජනයට ගත හැකි උපාය මාර්ග ගවේෂණය කරන ලද අතර ඔවුන්ගේ දුර්වලතා අවම කර ගැනීමට එහිදී සැලසුම් සකස් කරන ලදී.



රූපය 6 :-ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරීම.

## 8.2. උපාය මාර්ගික සැලැස්ම අතිගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කිරීම.

කිතුල් සංවර්ධන මණ්ඩලය 2021 දී ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස ස්ථාපිත කරන ලද අතර එය පිහිටුවීමට පෙර කිතුල් සම්බන්ධ සියලු කටයුතු අදාළ රේඛීය අමාත්‍යාංශය මඟින් සිදු කරන ලදි. මණ්ඩලය පිහිටුවීමෙන් පසු මුහුණ දුන් මූලික අභියෝගය මණ්ඩලයේ ඉදිරි ක්‍රියාකාරකම් දැක්වෙන උපාය මාර්ගික සැලැස්මක් සකස් කිරීම වේ. ඒ අනුව, මණ්ඩලයේ ඉදිරි ක්‍රියාකාරකම් විස්තර කෙරෙන උපාය මාර්ගික සැලැස්මක් නිර්මාණයකොට එය 2022 ජනවාරි මස 17 වන දින ගාල්ල හියාරේ ජලාශය ස්ථානයේ දී කිතුල් ව්‍යවසායකයින් 500කට අධික පිරිසකගේ සහභාගීත්වයෙන් අතිගරු ජනාධිපතිතුමා වෙත ප්‍රදානය කරන ලදි.



රූපය 7 :-කිතුල් ආශ්‍රිත නිෂ්පාදන




රූපය 8 :-කිතුල් ආශ්‍රිත නිෂ්පාදන



රූපය 9 :-කිතුල් ආශ්‍රිත නිෂ්පාදන




රූපය 10 :-කිතුල් ආශ්‍රිත නිෂ්පාදන



රූපය 11 :-කිතුල් ආශ්‍රිත නිෂ්පාදන

කිතුල් ව්‍යවසායකයන් 250 දෙනෙකුගේ සහභාගිත්වයෙන් කිතුල් කර්මාන්තයේ දියුණුව සඳහා මණ්ඩලයේ උපාය මාර්ගික මහ පෙන්වීම ඇතුළත් නව උපායමාර්ගික සැලැස්ම අතිගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කරන ලද අතර, කිතුල් කර්මාන්තයේ සංවර්ධනය සඳහා ඇති හැකියාවන් පිළිබඳ අතිගරු ජනාධිපතිතුමාගේ මැදිහත් වීමෙන් නිරීක්ෂණය කරන ලදී.

කිතුල් කර්මාන්තයේ සංකීර්ණ ක්‍රියාවලින් පිළිබඳ ඍජු අවබෝධයක් ලබා ගැනීමට අතිගරු ජනාධිපතිතුමන් වෙත ඉඩ සැලසුණු අතර එතුමන්ගේ පැමිණීම සහ ක්‍රියාකාරි මැදිහත් වීම මෙම සාම්ප්‍රදායික හා ආර්ථිකමය වශයෙන් වැදගත් අංශයට දක්වන සහයෝගය පිළිබඳ ව සාක්ෂියක් විය. තව ද මෙම උත්සවයේදී කිතුල් ක්ෂේත්‍රයේ ප්‍රගතිය සහ නවෝත්පාදනයන් ප්‍රදර්ශනය කිරීමට අවස්ථාවක් ලබා දෙන ලදී. කර්මාන්තයේ වර්ධනය සහ තිරසාර සංවර්ධනය සඳහා ඇති හැකියාව ඉස්මතු කිරීම, කිතුල් කර්මාන්තයේ වැදගත්කම සහ එහි අනාගත අපේක්ෂාවන් තවදුරටත් තහවුරු කරමින් නිරීක්ෂණ කටයුතු සඳහා අතිගරු ජනපතිතුමාගේ සහභාගිත්වය වැඩසටහනට සුවිශේෂී මානයක් එක් කළේ ය. කලාපයේ කිතුල් කර්මාන්තයේ නගාසිටුවීම සඳහා සහයෝගිතාව, අදහස් හුවමාරු කර ගැනීම සහ කැපවීම ශක්තිමත් කිරීම සඳහා මෙය අගනා අවස්ථාවක් විය.

**කිතුල් මල් කැපීම :**

කිතුල් ආශ්‍රිත නිෂ්පාදනයේ අත්‍යවශ්‍ය අංගයක් වන කිතුල් මල් කැපීමේ ක්‍රියාවලිය අතිගරු ජනාධිපතිතුමාගේ අවධානයට යොමුවිය. මෙම ක්‍රියාකාරකම නිෂ්පාදන දාමයේ ආරම්භක අදියර පෙන්නුම් කරන අතර තිරසාර අස්වනු නෙළීමේ ක්‍රමවේදවල වැදගත්කම ඉස්මතු කෙරේ.

කිතුල් පැණි නිෂ්පාදනය නිරීක්ෂණය කිරීම :

කිතුල් ආශ්‍රිත විවිධ නිෂ්පාදන සඳහා භාවිතා කරන අමුද්‍රව්‍යයක් වන තෙලිදිය මගින් කිතුල් පැණි නිෂ්පාදනය ජනාධිපතිතුමාගේ නිරීක්ෂණයට ලක් විය.

කිතුල් නිෂ්පාදන ක්‍රියාවලිය පිළිබඳ අවබෝධයක් ලබා ගනිමින් කිතුල් නිෂ්පාදනය සිදු වන ස්ථාන පිළිබඳව අතිගරු ජනාධිපතිතුමා සොයා බැලීය. මීට අමතරව, කිතුල් කර්මාන්තය තුළ නිෂ්පාදන කාර්යක්ෂමතාව සහ ගුණාත්මක භාවය ඉහළ නැංවීම සඳහා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරන නවීන තාක්ෂණික උපකරණ නැරඹීමට ඔහුට අවස්ථාව ලැබුණි. කිතුල් මැදීමේ සිට අවසන් නිෂ්පාදනය දක්වා කිතුල් කර්මාන්තයේ විවිධ අවස්ථා පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා ගැනීමට මෙම නිරීක්ෂණ මඟින් අතිගරු ජනාධිපතිතුමාට හැකි විය.

අනතුරුව කිතුල් කර්මාන්තයේ අනාගත ගමන් මග පෙන්වා දෙන කෙටි වාර්තාමය ශ්‍රව්‍ය දෘශ්‍ය වැඩසටහනක් කිතුල් සංවර්ධන මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලදි.

කිතුල් නිෂ්පාදන ජාත්‍යන්තර මට්ටමින් ප්‍රවර්ධනය කිරීම සහ අලෙවි කිරීම තුළින් ප්‍රයෝජනයට ගත හැකි ආර්ථික අවස්ථා සහ වර්ධන අපේක්ෂාවන් අවධාරණය කිරීම මෙම වැඩසටහනේ අරමුණ විය. වාර්තා චිත්‍රපටය ඉදිරිපත් කිරීම තුළින් කිතුල් කර්මාන්තයේ ඉදිරි ගමන පිළිබඳ අවබෝධයක් ලබා දීමට හැකි විය. ගෝලීය වෙළෙඳපොළ තුළ කිතුල් ඉල්ලුමට සරිලන නිෂ්පාදනයක් වශයෙන් ස්ථාපිත කිරීමේ උපාය මාර්ගික සැලසුම් සහ ඵලදායි අලෙවිකරණ උපායමාර්ගවල වැදගත්කම එමඟින් පෙන්නුම් කළ අතර, අවසානයේ කලාපයේ ආර්ථික සංවර්ධනයට සහ කිතුල් ව්‍යවසායකයින් සවිබල ගැන්වීමට දායක වීම ශ්‍රව්‍ය දෘශ්‍ය ප්‍රවේශයකින් පෙන්වා දෙන ලදී.

**ඒ අනුව යමින් අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් වැදගත් කාර්යයන් කිහිපයක් ඉටු කරන ලදී.**

- කිතුල් සංවර්ධන මණ්ඩලයේ උපාය මාර්ගික සැලැස්ම පිළිගැන්වීම : කිතුල් කර්මාන්තයේ දියුණුව සඳහා වූ උපාය මාර්ගික මුලපිරීම් සහ ඉලක්ක සඳහන් කරමින් කිතුල් සංවර්ධන මණ්ඩලයේ උපාය මාර්ගික සැලැස්ම අතිගරු ජනාධිපතිතුමා වෙත පිළිගැන්විය. කිතුල් ක්ෂේත්‍රය තුළ තිරසාර වර්ධනයක් සහ ආර්ථික සවිබල ගැන්වීමක් ප්‍රවර්ධනය කිරීමට මණ්ඩලයේ කැපවීම මෙම ඉදිරිපත් කිරීම තුළින් ඉස්මතු විය.

- **කිතුල් පැණි සඳහා ප්‍රමිතියක් ඇති කිරීම:** කැපී පෙනෙන වර්ධනයක් තුළ, ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යාංශය කිතුල් පැණි සඳහා නිශ්චිත ප්‍රමිතියක් සකස් කරන ලදී. ශ්‍රී ලංකාව තුළ කිතුල් පැණි සඳහා පළමුවරට ප්‍රමිතිගත මාර්ගෝපදේශයක් හඳුන්වා දීමේ  වැදගත්කම අවධාරණය කරමින් ප්‍රමිතිය අඩංගු ප්‍රකාශය අතිගරු ජනාධිපතිතුමා වෙත පිළිගන්වන ලදී. කිතුල් පැණි නිෂ්පාදන සඳහා තත්ත්ව සහතිකයේ වැදගත්කම, තරඟකාරීත්වයේ වැදගත්කම, අවධාරණය කරමින් ප්‍රමිතිය අඩංගු ප්‍රකාශය ද අතිගරු ජනාධිපතිතුමා වෙත පිළිගන්වන ලදී.

- වැවිලි අමාත්‍යාංශය යටතේ ඇති වැවිලි කර්මාන්ත පුහුණු ආයතනය (NIPM) කිතුල් මැදීමේ පුහුණුව ලැබූ පුද්ගලයින් සඳහා සහතික පත් ප්‍රදානය කරන ලදි. කිතුල් වගාව සහ නිෂ්පාදන ක්ෂේත්‍රයේ ඔවුන්ගේ නිපුණතා සහ දැනුම මෙම ඇගයීම් මඟින් කර්මාන්තය තුළ විශේෂඥතාව සහ වෘත්තීය භාවය ඉහළ නැංවීමට ඇති කැපවීම ඉස්මතු විය.

- **තාක්ෂණික උපකරණ කට්ටල ලබාදීම:** කිතුල් කර්මාන්තයේ නියැලී සිටින ව්‍යවසායකයින්ට තවදුරටත් උපකාර කිරීමේ මාධ්‍යයක් ලෙස තාක්ෂණික උපකරණ කට්ටල පිරිනැමීය. ඔවුන්ගේ නිෂ්පාදන හැකියාවන් වැඩි දියුණු කිරීම, නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීම සහ ඔවුන්ගේ ව්‍යාපාර තුළ නවීන තාක්ෂණික ක්‍රම භාවිතා කිරීමට පහසුකම් සැලසීම මේ සඳහා අරමුණු කර ගනු ලැබී ය.

- **සමරු තිළිණ පිරිනැමීම :** සමරු තිළිණයක් පිරිනැමීමෙන් වැඩ සටහන අවසන් විය.

  සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන පිහිටුවීම මඟින් ලද මෙම සිහිවටනය කිතුල් කර්මාන්තයේ ප්‍රගමනය, තිරසාර සංවර්ධනය සහ සහභාගීවන්නන් අතර අභිමානය සහ එකමුතුකම වර්ධනය කිරීම සඳහා සිදු කරන ලද සාමූහික ප්‍රයත්න සහ ජයග්‍රහණ සංකේතවත් කරන ලදි.

  අතිගරු ජනාධිපතිතුමා විසින් සිදු කරන ලද මෙම කටයුතු කිතුල් කර්මාන්තය සඳහා ඔහුගේ ක්‍රියාකාරී දායකත්වය සහ සහයෝගය පෙන්නුම් කළේ ය. ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් එහි වර්ධනය, සංවර්ධනය හා පිළිගැනීම සඳහා රජයේ කැපවීම අවධාරණය කරයි.



**රූපය 12 :-කිතුල් ලීයෙන් සිදු කර ඇති නිෂ්පාදන**

## 8.3 ගෘහ කර්මාන්තය සඳහා ආරක්ෂක උපකරණ කට්ටල ලබා දීම.

කිතුල් මැදීමේ කර්මාන්තයේ නියැලෙන අයට එම කර්මාන්තය සාර්ථකව කර ගෙන යාමට උපකාරී වන උපකරණ කට්ටල (හිසේ පළඳින ආරෝපණය කළ හැකි විදුලි පන්දම්, තොප්පි, වැහිකබා, බාල්දි, ආරක්ෂිත සපත්තු) බෙදා දීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි. ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගේ උපදෙස් හා මඟ පෙන්වීම මත 2022.09.29 වන දින එම කර්මාන්තය පවතින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කිහිපයක මල් කැපීමේ කර්මාන්තයේ යෙදී සිටින පුද්ගලයන්ට උපකරණ කට්ටල බෙදා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට අප මණ්ඩලය මැදිහත් විය.

2022 පෙබරවාරි 17 වන දින ගාල්ල හියාරේ පැවති වැඩසටහනේ දී අතිගරු ජනාධිපතිතුමා විසින් අක්මීමන ප්‍රාදේශීය ලේකම්වරයා වෙත එම උපකරණ ප්‍රදානය කරන ලදි. මෙම උපකරණ බෙදා හැරීම සඳහා ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට අයත් පහත සඳහන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් අයදුම්පත් කැඳවන ලදි.

පහත සඳහන් ලැයිස්තුව ඉහත සඳහන් කළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් ලැබුණු ලැයිස්තුවට අනුව සකස් කර ඇත. ලැයිස්තුව පහත පරිදි වේ.

| ප්‍රාදේශීය ලේකම් කාර්යාල | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|
| ඇල්පිටිය | 61 |
| වැලිවිටිය දිවිතුර | 04 |
| නියා ගම | 45 |
| වදුරඹ | 02 |
| නාගොඩ | 19 |
| තවලම | 42 |
| නෙළුව | 70 |
| **එකතුව** | **243** |

ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අවශ්‍ය සම්පත් සහ සහයෝගය ලබා දීම ට හා බෙදා හැරීමේ වැඩසටහන සුමට ව ක්‍රියාත්මක කිරීම සහතික කිරීමට මණ්ඩලය කැප වන ලදී.

කලාපයේ මුළු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සංඛ්‍යාව 7කි. කෙසේ වෙතත් ප්‍රවාහනය හා සම්බන්ධ අභියෝග සලකා බැලීමේ දී  වෙනම වැඩසටහන් 07ක් සංවිධානය කර අවශ්‍ය සම්පත් බෙදා හැරීමේ වැඩසටහන් ස්ථාන 04ක දී පැවැත්වීමට මණ්ඩලය තීරණය කර ඇත. මෙම ප්‍රවේශය ක්‍රියාත්මක කිරීමෙන් බෙදා හැරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම, පිරිවැය අඩු කිරීම සහ උපකරණ නියමිත වෙලාවට නියමිත ප්‍රතිලාභීන් වෙත ළඟා වන බව සහතික කිරීම මණ්ඩලයේ අරමුණයි. මෙම තීරණය ගෙන ඇත්තේ ප්‍රතිලාභීන්ගේ යහපත සහ වැඩසටහනේ කාර්යක්ෂමතාව අරමුණු කරගෙනය. ප්‍රතිලාභීන්ගේ පහසුව සඳහා පහත විධිවිධාන සලසන ලදී. කාර්යක්ෂමව සංවිධානය  සහ සම්පත් ඵලදායි ලෙස භාවිතා කිරීමේ වැදගත්කම මණ්ඩලය විසින් හඳුනාගෙන ඇති අතර, එම නිසා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 වෙත ළඟා වීමේ දී ඇතිවෙන සැපයුම් අභියෝග අවම කිරීම සඳහා මෙම ස්ථාන 04 තෝරා  ගන්නා ලදී.

## 8.4 කිතුල් ගොවි සමිති සංවිධානය කිරීම.

තාක්ෂණික දියුණුව සහ වෙනස්වන පාරිභෝගික කැමැත්ත විසින් කර්මාන්තවල පරිවර්තනයක් හා තිරසාර වර්ධනයක් මේ යුගයේ සිදු වී ඇත. සාම්ප්‍රදායික ග්‍රාමීය ප්‍රදේශවලට සීමා වූ කිතුල් කර්මාන්තය දැන් කැපී පෙනෙන පරිවෘත්තීය ක්‍රියාවලියකට සූදානම් ව සිටී. වෙනස් වීම් සහ නවෝත්පාදනයන් සඳහා කැපවී සිටින කිතුල් කර්මාන්තය එහි අද්විතීය හා අව්‍යාජ වටිනාකම් ආරක්ෂා කරන නවීකරණය වූ සහ විවිධාංගීකරණය වූ අංශයක් බවට පත් කිරීමේ කාර්යය භාරය කිතුල් සංවර්ධන මණ්ඩලය භාර ගෙන ඇත. එසේම,ශ්‍රී ලාංකේය සාම්ප්‍රදායන් සහ උරුමයන් තුළ ගැඹුරින් මුල් බැසගත් කිතුල් කර්මාන්තය කිතුල් ගසේ යුෂ වලින් ලබා ගත් විශිෂ්ට නිෂ්පාදන සඳහා දිගු කලක් තිස්සේ අගය කර ඇත. කෙසේ වෙතත් මෙම කර්මාන්තයේ ඇති සීමිත නිරාවරණය සහ තාක්ෂණය භාවිතයේ ඌනතාවය හේතුවෙන් මෙම කර්මාන්තයේ විභවය බොහෝ දුරට ප්‍රයෝජනයට ගෙන නොමැත. තාක්ෂණික ඒකාබද්ධ කිරීම හා නූතන තාක්ෂණික වෙනස්වීම් උපයෝගී කරගනිමින්, කර්මාන්තයේ පූර්ණ විභවය ප්‍රයෝජනයට ගෙන, එය ගෝලීය තත්වයට උසස් කිරීම මෙම මණ්ඩලයේ අරමුණයි. මෙම පරිවර්තනීය වෙනස ඇති කිරීම හා

ඒ සඳහා ඵලදායිතාව ගුණාත්මකභාවය සහ වෙළෙඳපොළ ප්‍රවේශය ඉහළ නැංවීම සඳහා තාක්ෂණය ඉටු කරන තීරණාත්මක කාර්යභාරය මෙම මණ්ඩලය හඳුනාගෙන ඇත. උපාය මාර්ගික හවුල්කාරීත්වය සහ සහයෝගීතාව හරහා, කාර්යක්ෂමතාව ප්‍රශස්ත කිරීම ඒ සඳහා ඇති නවීන යන්ත්‍රෝපකරණ සහ නිෂ්පාදන ශිල්පීය ක්‍රම හඳුන්වා දීමට මෙම මණ්ඩලය අපේක්ෂා කෙරේ.

අතින් සිදුකරන ශ්‍රමය  අවම කිරීම, ස්වයංක්‍රීය කරණය සහ ඩිජිටල් විසඳුම් උපයෝගී කර ගනිමින්, කිතුල් නිෂ්පාදනවල සත්‍යතාව සහ සුවිශේෂීත්වය පවත්වා ගනිමින් මිල ගණන් විධිමත් කිරීමට මෙම මණ්ඩලය විසින් කටයුතු කිරීමට නියමිත ය. කිතුල් නිෂ්පාදනවල හරය ආරක්ෂා කරන අතරම ලොව පුරා පාරිභෝගිකයන්ගේ විකාශනය වන රුචි අරුචිකම් හා මනාපයන් සපුරාලන විවිධාංගීකරණය වූ කර්මාන්තයක් බිහිකිරීම මෙම මණ්ඩලය අපේක්ෂාවයි.

පරිපූර්ණ වෙළෙඳපොළ පරීක්ෂණ සිදු කිරීමෙන් සහ ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් සමඟ සම්බන්ධ වීමෙන්, අපි නව නිෂ්පාදන අවස්ථා හඳුනා ගෙන රසැති ආහාරයෙන් කිතුල් ව්‍යුත්පන්නයන්ගේ නව්‍ය යෙදුම් ගවේෂණය කරන්නෙමු. ආහාර ද්‍රව්‍ය ස්වාභාවික රසකාරක හා සෞඛ්‍ය අතිරේක, හැකියාවන් අසීමිත ය. අපගේ පරිවර්තනීය ගමන නවීකරණය සහ විවිධාංගීකරණය ඉක්මවා යයි. එය කිතුල් කර්මාන්තයට සම්බන්ධ ග්‍රාමීය ප්‍රජාවන් සවිබල ගැන්වීම දක්වා විහිදේ. සීඝ්‍රයෙන් වෙනස් වන ලෝකය තුළ දියුණු වීමට අවශ්‍ය දැනුම සහ මෙවලම්වලින් ගොවීන් සහ ශිල්පීන් සන්නද්ධ කිරීම සඳහා පුළුල් පුහුණු වැඩසටහන් සහ නිපුණතා සංවර්ධනය කිරීමට මෙම මණ්ඩලය කැපවී සිටී. ව්‍යවසායකත්වය පෝෂණය කිරීම සහ සාධාරණ වෙළෙඳ පරිචයක් සහතික කිරීමෙන් කිතුල් කර්මාන්තයේ අගය දාමයට සම්බන්ධ අයගේ ජීවනෝපාය නගා සිටුවීම මෙම මණ්ඩලයේ අරමුණකි. නවීන තාක්ෂණය වැලඳ ගනිමින්, නවෝත්පාදනයන් පෝෂණය කිරීමෙන් සහ ග්‍රාමීය ප්‍රජාව සවිබල ගන්වමින් කිතුල් කර්මාන්තය එහි සුවිශේෂී නිෂ්පාදන සහ අව්‍යාජත්වය සඳහා වූ නොසැලෙන කැපවීම සඳහා ප්‍රසිද්ධියට පත් වූ ගෝලීය වශයෙන් පිළිගත් හා කීර්තිමත් අංශයක් බවට පත් කිරීමට මෙම මණ්ඩලය අපේක්ෂා කරයි.

ඒ අනුව, 2022 වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම තුළ, ඉහත කී කිතුල් ගොවි සමිති පිහිටුවීම සහ බල ගැන්වීම අරමුණු කරගත් ව්‍යාපෘති සඳහා මිලියන 1 ක අයවැය ප්‍රතිපාදන අනුමත කරන ලදී. ඉහත සඳහන් කළ ව්‍යාපෘතිය යටතේ කිතුල් නිෂ්පාදකයින් සංවිධානය කිරීම, මානව කුසලතා වර්ධනය සහ සමාජ සවිබල ගැන්වීම කෙරෙහි අවධානය යොමු කරමින් පුළුල් මුලපිරීමක් ක්‍රියාත්මක කිරීම සඳහා පදනම සකස් කරන ලදි. මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවේ කිතුල් කර්මාන්තය බහුලව පවතින දිස්ත්‍රික්ක 11 පුරා 2022 සහ 2023 වසර පුරා ක්‍රියාත්මක කිරීමට යෝජිත ය. මීට පෙර ද ක්‍රියාත්මක වුවද කිතුල් කර්මාන්තයේ නියැලෙන පුද්ගලයන් එක්සේසත් කිරීමේ අරමුණින් ක්‍රියාත්මක වන සමාජ ක්‍රමයේ, වර්තමාන තත්වයෙන් පෙනී යන්නේ සමිති ක්‍රමය අක්‍රිය බව ය.

එබැවින් මෙම සමිති ප්‍රතිසංවිධාන ක්‍රමයකට ලක් විය යුතු බව කිතුල් සංවර්ධන මණ්ඩලයේ අදහසයි. තරුණ නායකත්වය ලබා ගැනීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින්, මීට අමතරව මෙම කර්මාන්තයේ ස්වේච්ඡාවෙන් සම්බන්ධ වීම දිරිගැන්වීම සඳහා අවශ්‍ය මානසික උත්තේජනයන් ඇති කිරීම ඉතා වැදගත් වේ. කිතුල් සංවර්ධන මණ්ඩලය මෙම සමිති වලට ව්‍යාපාර ඉලක්ක කරගත් අනන්‍යතාවක් ලබා දීම ද අරමුණු කරයි. එවැනි ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීම කර්මාන්තයේ සහභාගී වන්නන් අතර හුදෙකලා වීම හෝ හුදකලාව යන හැඟීම ඵලදායි ලෙස දුරු කරනු ඇතැයි මණ්ඩලය තරයේ විශ්වාස කරනු ලබයි. තවද, එය ස්වාධීනව නැගී සිටිය හැකි ඒකාබද්ධ කණ්ඩායමක් නිර්මාණය කිරීම පෝෂණය කරනු ඇත. අප සාමූහික ව මුහුණ දෙන මූලික අභියෝගයක් නම්, විශේෂයෙන්ම දැනට පවතින covid-19 වසංගතය සහ ශ්‍රී ලංකාව තුළ පවතින ආර්ථික අර්බුදය හමුවේ, අපනයන වැඩි කිරීම අත්‍යවශ්‍ය වීමයි.

## 8.4.1 කිතුල් නිෂ්පාදකයින්ගේ සංවිධානය,
## මානව දක්ෂතාවයන් වර්ධනය සහ සමාජ බල ගැන්වීම් වැඩසටහන (ගාල්ල දිස්ත්‍රික්කය)

කිතුල් ව්‍යවසායකයින්ගේ සංවිධානය, එහි  මානව නිපුණතා සංවර්ධනය සහ සමාජ සවිබල ගැන්වීමේ වැඩසටහනට සමගාමීව කිතුල් කර්මාන්තය නගා සිටුවීම සහ ක්ෂේත්‍රය තුළ පුද්ගලයින් සවිබල ගැන්වීම අරමුණු කරගනිමින් කිතුල් ව්‍යවසායකත්ව  සංවිධානය කිතුල් කර්මාන්තයේ නියැලී සිටින පුද්ගලයින්ගේ හැකියාවන් වැඩි දියුණු කිරීම සඳහා මානව කුසලතා වර්ධනය කිරීමේ වැදගත්කම හඳුනා ගනී. එහි මානව නිපුණතා සංවර්ධන වැඩසටහන හරහා ගොවීන් කලාකරුවන් සහ අනෙකුත් පාර්ශවයන්ට තිරසාර වර්ධනයක් සහ සාර්ථකත්වයක් සඳහා අවශ්‍ය දැනුම සහ කුසලතා ලබා දීම  සඳහා පුළුල් පුහුණුවක් සහ අධ්‍යාපනික මුලපිරීම් සපයයි.

මීට අමතරව, සංවිධානය විසින් ක්‍රියාත්මක කරන ලද සමාජ සවිබල ගැන්වීමේ වැඩසටහන කිතුල් කර්මාන්තය හා සම්බන්ධ ග්‍රාමීය ප්‍රජාව නගා සිටුවීම අරමුණු කරගෙන ක්‍රියාත්මක කරන ලදී. ව්‍යවසායකත්වය වර්ධනය කිරීම, සම්පත් වෙත ප්‍රවේශය පහසු කිරීම සහ සාධාරණ  වෙළෙඳ ආදර්ශ පෝෂණය කිරීම මඟින්, පුද්ගලයන්ගේ සමාජ ආර්ථික තත්ත්වයන් වැඩි දියුණු කිරීමට සහ ඔවුන්ගේ සමස්ත යහපැවැත්ම සඳහා අවස්ථාව ලබා දීමට උත්සාහ කරයි. මෙම ඒකාබද්ධ ප්‍රයත්නය තුළින්  කිතුල්  නිෂ්පාදකයින්ගේ සංවිධානය පුද්ගල සවිබල ගන්වන නවෝත්පාදනයන් පෝෂණය කරන සහ කිතුල් කර්මාන්තයේ තිරසාර සංවර්ධනයට දායක වන පරිසර පද්ධතියක් නිර්මාණය කිරීමට උත්සාහ කරයි.

කිතුල් කර්මාන්තය නව තලයකට ඔසවා තැබීමේ අරමුණින් කිතුල් සංවර්ධන මණ්ඩලය සිය පළමු ව්‍යාපෘති ක්‍රියාකාරකම් ගාල්ලේ දී සංවිධානය කළේ ය. නෙළුව, අක්මීමන, වැලිවිටිය, දිවිතුර, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 11 ක උද්‍යෝගිමත් කිතුල් ව්‍යවසායකයින් 120ක් පමණ සහභාගි වූ මෙම උත්සවය ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී  පැවැත්විණි. නාගොඩ, ඉමදූව, යක්කල මුල්ල, බද්දේගම, ඇල්පිටිය, නියාගම, තවලම සහ වඳුරඹ ප්‍රදේශවලින් ව්‍යවසායකයින් සහභාගී විය. මෙම උත්සවය ගාල්ලේ දී පවත්වනු ලැබීය.

වැඩසටහනේ ගෞරවනීය සම්පත්දායකයෙක් ලෙස ආචාර්ය චමින්ද වීරසිරිවර්ධන මහතා ද කිතුල් ව්‍යවසායකයින් සඳහා “මනෝ විද්‍යාත්මක ඇසින් ව්‍යවසායකත්වය" යන මැයෙන්  දැනුවත් කිරීමේ වැඩසටහනක් මෙහෙයවන ලදි. මෙම වැඩසටහන මඟින් ව්‍යවසායකත්වය සඳහා මනෝ විද්‍යාව ඉටු කරන තීරණාත්මක කාර්යභාරය පිළිබඳ ව පැහැදිලිකරන ලදී. ඔහුගේ ප්‍රවීණත්වය කිතුල් ව්‍යවසායකයින්ට අද්විතීය පූර්ව දර්ශනයක් සපයා දී ඔවුන්ගේ මනෝ විද්‍යාවේ බලය ඔවුන්ගේ අවසාන ව්‍යවසායකත්වයට යොදා ගැනීමට ඔවුන්ව බල ගන්වා ඇත. "මනෝ විද්‍යාත්මක ඇස් හරහා ව්‍යවසායකත්වය " කිතුල් ව්‍යවසායකයන්ට ඔවුන්ගේ ව්‍යවසායකත්ව ගමන පිළිබඳ නැවුම් ඉදිරි දැක්මක් ලබා දෙමින් ඔවුන්ගේ නෙත් විවර කරන අත්දැකීමක් විය. වීරසිරිවර්ධන මහතා මගපෙන්වූ සහභාගි වන්නන්ගේ මානසිකත්වය, අභිප්‍රේරණය, ඔරොත්තු දීමේ හැකියාව, අවදානම් ගැනීම සහ නවොත්පාදනය වැනි මාතෘකා ගවේෂණය කරන විවිධ මනෝ විද්‍යාත්මක මානයන් හරහා මෙම තීරණාත්මක ක්ෂේත්‍ර  පිළිබඳ සොයා බැලීමෙන් තිරසාර  වර්ධනයක් සහ සාර්ථකත්වයක් සඳහා අවශ්‍ය මනෝ විද්‍යාත්මක මෙවලම් වලින් කිතුල් ව්‍යවසායකයන් සන්නද්ධ කිරීම  වැඩසටහනේ අරමුණ විය. වැඩසටහන පුරාම ආචාර්ය වීරසිරිවර්ධන මහතා විසින් ව්‍යවසායකත්ව මානසිකත්වය වැඩි දියුණු කිරීම සඳහා අගනා අවබෝධයක්, පර්යේෂණ පිටුබලය සහිත සොයා ගැනීම් සහ ප්‍රායෝගික උපායමාර්ග බෙදා හදා ගන්නා ලදි. මෙම මූලධර්ම අනුගමනය කිරීමෙන් කිතුල් ව්‍යවසායකයින්ට අභියෝග ජය ගැනීමටත් නවෝත්පාදනයන් වැළඳ ගැනීමටත් කිතුල් කර්මාන්තයේ දියුණු  ව්‍යාපාර ගොඩ නැගීමටත් බල ගැන්විණි. මෙම වැඩසටහන අන්තර් ක්‍රියාකාරී සහ ආකර්ෂණීය සැසි සඳහා පහසුකම් සලසා ඇත. කිතුල් ව්‍යවසායකයින්ගේ ක්‍රියාකාරී සහභාගිත්වය දිරිමත් කිරීම ආචාර්ය වීරසිරිවර්ධන පෙන්වා දුන් අන්තර් ක්‍රියාකාරී ඉගැන්වීම් ක්‍රම, කණ්ඩායම් සාකච්ඡා සිද්ධි අධ්‍යයනය සහ අත්දැකීම් අභ්‍යාස ඇතුළුව සහභාගිවන්නන්ට ප්‍රායෝගික ඉගෙනීම් අත්දැකීමක් ඇති කරන බවට සහතික විය. මෙම සහයෝගී ක්‍රියාකාරකම් හරහා කිතුල් ව්‍යවසායකයින්ට තම අත්දැකීම් බෙදා ගැනීමට අවස්ථාව හිමි විය.

කෙසේ වෙතත්, මෙම උත්සවයේ වැදගත්ම ප්‍රතිඵලය වූයේ ගාලු දිස්ත්‍රික් කිතුල් ව්‍යවසායකයින්ගේ සංගම් පිහිටුවීම, ගාල්ල දිස්ත්‍රික්කයේ කිතුල් ව්‍යවසායකයින් එකමුතු කිරීම සහ ඔවුන්ට සහයෝගය දැක්වීමයි. ඔවුන්ට සහයෝගිතාව සඳහා වේදිකාවක් ලබා දීම, දැනුම හුවමාරු කර ගැනීම සහ නව අවස්ථා ගවේෂණය කිරීම එම කලාපයේ කිතුල් කර්මාන්තයේ වර්ධනය, සංවර්ධනය හා පෝෂණය

කිරීමේ තීරණාත්මක පියවරක් සනිටුහන් කිරීමයි. ගාල්ල දිස්ත්‍රික් කිතුල් ව්‍යවසායකයින්ගේ සංගමය පිහිටුවීමට අමතරව එම සංගමයේ නායකත්වය සහ කමිටුව පිහිටුවීම සඳහා වැදගත් පත්වීම් සහ නිලවරණ ද සිදු කරන ලදි. ගාල්ල දිස්ත්‍රික් ලේකම්වරයා සංගමයේ අනුශාසකවරයා ලෙස පත් කරන ලද අතර, ඒ ක්‍රියාකාරකම් සඳහා ඔවුන්ගේ සහයෝගය සහ මැදිහත් වීම පෙන්නුම් කරමින් කිතුල් වගාව ආවරණය වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 11 හි ප්‍රාදේශීය ලේකම්වරුන් විවිධ ප්‍රදේශ නියෝජනය කරන කැඳවුම්කරු තනතුරු ලෙස නම් කරන ලදි.

විවිධ අංශ අතර කාර්යක්ෂම සන්නිවේදනය, සම්බන්ධීකරණය, පහසුකම් සැපයීම සඳහා ප්‍රාදේශීය සම්බන්ධීකරණ නිලධාරීන් 11 දෙනෙකු පත් කරන ලදි. සංගමයට නායකත්වය දීමට, සභාපති වැනි ප්‍රධාන තනතුරු, උප සභාපති, ලේකම්, උප ලේකම් සහ භාණ්ඩාගාරික තේරී පත් විය. මෙම පුද්ගලයින් සංගමයේ දිශානතිය හැඩ ගැස්වීමේ දී, ක්‍රියාකාරකම් සංවිධානය කිරීමේ දී වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ඇත. මීට අමතරව, සංගමයේ ක්‍රියාකාරීත්වයට සහ තීරණ ගැනීමේ ක්‍රියාවලියට සක්‍රියව දායක වන නිලධාරීන් කිහිප දෙනෙකු කමිටු සාමාජිකයින් ලෙස තේරීපත් විය.

### 8.4.2 කිතුල් නිෂ්පාදකයින්ගේ සංවිධානය
### මානව දක්ෂතාවය වර්ධනය කිරීම සහ සමාජ බලගැන්වීමේ වැඩසටහන (මහනුවර දිස්ත්‍රික්කය)

කිතුල් සමිති පිහිටුවීම සහ බලගැන්වීමේ විස්තීරණ ව්‍යාපෘතිය දිස්ත්‍රික් 11ක් පුරා ක්‍රියාත්මක කෙරේ. මෙහි මුලපිරීමේ කොටසක් ලෙස දෙවැනි අදියර මණ්ඩලයේ අධීක්ෂණය යටතේ මහනුවර දිස්ත්‍රික්කයේ සිදු කිරීමට සූදානම් කර ඇත. කිතුල් නිශ්පාදකයින් සංවිධානය කිරීම, මානව කුසලතා සංවර්ධනයට පහසුකම් සැලසීම සහ සමාජ සවිබලගැන්වීම ප්‍රවර්ධනය කිරීම මෙම අදියරේ අරමුණයි. තිරසාර සංවර්ධනයේ තීරණාත්මක අංගයක් ලෙස සමාජ සවිබල ගැන්වීම මෙම ව්‍යාපෘතිය කෙරෙහි සැලකිය යුතු ලෙස අවධාරණය කරයි. කිතුල් නිෂ්පාදකයින් අතර සහය ලබා දීම සහ ප්‍රජාව පිළිබඳ හැඟීමක් ඇති කිරීම මඟින් සමාජ සහජීවනය සහ යහපැවැත්ම වැඩි දියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණයි. ධාරිතා වර්ධන වැඩසටහන් පරිසර සංරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ ව්‍යාපාර වැනි විවිධ මුලපිරීම් තුලින් මෙය සාක්ෂාත් කරගනු ඇත. කර්මාන්තය තුළ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ඇතුලත් කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ කිතුල් නිෂ්පාදකයින් සමාජයීය වශයෙන් සවිබල ගැන්වීම මඟින් සමස්ත ප්‍රජාව ම නගාසිටුවීම සඳහා ධනාත්මක සහ සහයෝගී පරිසර පද්ධතියක් නිර්මාණය කිරීම තුළින් සමස්ථ ප්‍රජාවගේ ජීවන තත්වය ඉහළ නැංවීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි. මේ සඳහා කිතුල් ව්‍යවසායකයින් 107 දෙනෙකු සහභාගි විය.

මහනුවර දිස්ත්‍රික්කයේ කිතුල් කර්මාන්තය සැලකිය යුතු ප්‍රමාණයක් පවතින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 10 ක් නියෝජනය කරමින් ව්‍යවසායකින් කිතුල් ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා තම කැපවීම ප්‍රදර්ශනය කරමින් වැඩසටහනට ඉතා උනන්දුවෙන් සම්බන්ධ වී ඇත. 2022.12.21 දින මහත් අපේක්ෂාවෙන් යුතුව මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සම්මන්ත්‍රණ ශාලාවේ දී ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන පැවැත්විණි. මහනුවර දිස්ත්‍රික් කිතුල් ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහනේ ප්‍රධාන සම්පත් දායකයා ලෙස ආචාර්ය චමින්ද වීරසිරිවර්ධන මහතා ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කළේ ය. වැඩසටහනේ කොටසක් ලෙස “මනෝ විද්‍යාත්මක ඇසින් ව්‍යවසායකත්වය" යන මැයෙන් ආකර්ෂණීය සහ ප්‍රබෝධමත් සැසියක් ආචාර්ය වීරසිරිවර්ධන මහතා විසින් පවත්වන ලදී. ප්‍රතිලාභීන් සාර්ථකත්වය කරා මෙහෙයවීමට ඔහුගේ ගැඹුරු ප්‍රවීණත්වය සහ දැනුම ඉවහල් විය. මෙම සැසියේ ප්‍රධාන අරමුණ වූයේ ව්‍යවසායකත්වය පිළිබඳ නැවුම් ඉදිරි දර්ශනයක් ඉදිරිපත් කිරීමල අභියෝග ජය ගැනීමට සහ නව අධිෂ්ඨානයකින් තම ඉලක්ක කරා යාමට සහභාගි වන්නන් පෙළඹවීමයි.

කිතුල් පැණි සහ හකුරු නිෂ්පාදනය සඳහා විවිධ අමුද්‍රව්‍ය මිශ්‍ර කිරීම අද වෙළෙඳපොළේ පවතින ප්‍රධාන අභියෝගයකි, නිදසුනක් වශයෙන් සමහර ව්‍යවසායකයින් සීනි වැඩි කර ගැනීම සඳහා සීනි භාවිතා කරයි. කෙසේ වෙතත් අවසාන නිෂ්පාදනයේ ගුණාත්මකභාවය අඩාල වන අතර එහි ප්‍රතිඵලයක් ලෙස පරිභෝජනය විශ්වාසය සහ මිල දී ගැනීමට ඇති කැමැත්ත අඩු විය. පාරිභෝගිකයන්ට සෑම විටම උසස් තත්වයේ නිෂ්පාදනයක් ලබා දීම අත්‍යවශ්‍ය වේ.

මෙම වැඩමුළුවේ දී මධ්‍යම පළාත් සමුපකාර කොමසාරිස්වරයා විසින් සමුපකාර ක්‍රමය හරහා ලබාදිය හැකි පුළුල් සේවා පරාසයක් පිළිබඳ ගැඹුරු ඉදිරිපත් කිරීමක් සිදු කරන ලදී. සමුපකාර

ක්‍රමය ජනතාවට කේන්ද්‍ර කරගත් ව්‍යාපාර යන්ත්‍රණයක් ලෙස අවධාරණය කරමින් කිතුල් කර්මාන්තයේ නියැලී සිටින පුද්ගලයින් පොලඹවා ගැනීමේ හැකියාව කොමසාරිස්වරයා විසින් ඉස්මතු කරන ලදි.

## 8.5 කිතුල් සංචාරක සත්කාරක ගම්මාන (ලංකා ගම)

කිතුල් සංචාරක සත්කාරක ගම්මාන ව්‍යාපෘතිය මඟින් කිතුල් ව්‍යවසායක සමිති පිහිටුවීම හා සවිබල ගැන්වීම තුලින් ඔවුන් එකමුතු කර ගැනීම අරමුණු කර ගනිමින් සංචාරක ව්‍යාපාරය තුළ ඔවුන්ගේ කාර්යභාරය ඉහළ නැංවීම අරමුණු කරගෙන ඇත. මෙම නවෝත්පාදන වැඩසටහන ශ්‍රී ලංකාව තුළ බහුලව දක්නට ලැබෙන වටිනා ස්වාභාවික සම්පතක් වන කිතුල් එහි ඇති සුවිශේෂී ගුණාංග ප්‍රයෝජනයට ගැනීමට අපේක්ෂා කරයි. කිතුල් ව්‍යවසායකයින්ට සංචාරක කර්මාන්තය තුළ දියුණු වීමට අවශ්‍ය සහයෝගය සහ සම්පත් බෙදා දෙමින් ඔවුන් නගා සිටුවීම ව්‍යාපෘතියේ මූලික අරමුණයි. තිරසාර වගා පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම සහ උසස් තත්වයේ කිතුල් නිෂ්පාදන නිෂ්පාදනය සහතික කිරීම මඟින් දේශීය හා විදේශීය සංචාරකයන් ආකර්ශනය කර ගනිමින් කිතුල් ආශ්‍රිත නිෂ්පාදනවල වටිනාකම් ඉහළ නැංවීම ව්‍යාපෘතියේ අරමුණයි.

කිතුල් සංචාරක සත්කාරක ගම්මාන පිහිටුවීම මෙම ව්‍යාපෘතියේ එක් ප්‍රධාන උපාය මාර්ගයකි. මෙම ගම්මාන කිතුල් ආශ්‍රිතව සංචාරක ක්‍රියාකාරකම් සඳහා කේන්ද්‍රස්ථානයක්වනු ඇත. මෙම ගම්මාන ව්‍යවසායකයන්ට තම නිෂ්පාදන ප්‍රදර්ශනය කිරීමට වේදිකාවක් වනු ඇත. සංචාරකයන් සමග සම්බන්ධ වී කිතුල් කැපීමෙ ආදර්ශන, සාම්ප්‍රදායික කිතුල් නිෂ්පාදන නිෂ්පාදනය සහ සංස්කෘතික ප්‍රසංග වැනි ගිලිහීයන අත්දැකීම් ලබා දීම, තවද නිෂ්පාදන පිළිබඳ ව ඔවුන්ගේ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා වැඩමුළු පුහුණු සැසි සහ උපදේශන වැඩසටහන් සංවිධානය කරනු ලැබේ. කිතුල් සංචාරක සත්කාරක ගම්මාන ව්‍යාපෘතිය මඟින් කිතුල් හි ආර්ථික විභවය සහ දේශීය ප්‍රජාවට එහි දායකත්වය හඳුනා ගෙන සංචාරකයින්ගේ විවිධ අවශ්‍යතා සපුරාලන අද්විතීය සහ අලෙවි කළ හැකි කිතුල් ආශ්‍රිත අත්දැකීම් නිර්මාණය කිරීමට මෙමඟින් ඔවුන්ට හැකි වේ. වටිනාකම් ක්ෂේත්‍රය ශක්තිමත් කිරීම සහ එය සංචාරක කර්මාන්තයට ඒකාබද්ධ කිරීම මඟින් රැකියා අවස්ථා උත්පාදනය කිරීම, තිරසාර ජීවනෝපාය ප්‍රවර්ධනය කිරීම, කිතුල් වගාව සහ ප්‍රයෝජනයට සම්බන්ධ පාරම්පරික දැනුම හා භාවිතයන් ආරක්ෂා කිරීම ව්‍යාපෘතියේ ඉලක්ක වේ.

නෙළුව ප්‍රාදේශීය ලේකම්තුමාගේ සහයෝගයෙන් හා සංවිධානයෙන් 2022 .12.03 දින ලංකාගම සිංහරාජ පරිසර ලැගුම් හල් පරිදි සුවිශේෂී සිදුවීමක් සිදුවිය. කිතුල් සංවර්ධන මණ්ඩලයේ සභාපති ගිහාන් පෙරේරා මහතා (නීතිඥ), සාමාන්‍යාධිකාරී ශිරානි වීරකෝන් මහත්මියගේ මැදිහත්වීමෙන් ලංකා ගම කිතුල් කර්මාන්තයේ සාමාජිකයින්, ඔවුන්ගේ පවුල් වල සාමාජිකයින් සහ රුහුණු සංචාරක කර්මාන්තයේ සභාපති, කළමනාකරණ අධ්‍යක්ෂ දකුණු පලාත් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ සභාපති වැනි කැපී පෙනෙන පුද්ගලයින් සහ ප්‍රාදේශීය ආර්ථික සංවර්ධන නිලධාරීන් විසින් සලකුණු කරන ලදි.

ලංකාගම සංචාරක සත්කාර ගම්මාන වැඩසටහනේ මුල් ගල් තැබීමේ උත්සවය සඳහා ව්‍යාපෘතියේ සුවිශේෂී කාර්යභාරයක් ඉටු කළ පුද්ගලයන් 88 දෙනෙකු පමණ එක්රැස් විය. ලංකාගම සංචාරක සත්කාරක ගම්මාන වැඩසටහනේ සාර්ථකත්වය සඳහා සියලුම පාර්ශවකරුවන්ගේ කැපවීම මෙම උත්සවයේ සංකේතවත් කරන ලදි.

මෙම වැඩසටහන සඳහා සම්පත් දායකත්වය සබරගමුව විශ්ව විද්‍යාලයේ පීඨාධිපති මහාචාර්ය එම්.එස්.එම්. අස්ලම් මහතා විසින් සපයන ලදි. මෙම උත්සවයේදි මහාචාර්ය අස්ලම් මහතා ලංකා ගම සංචාරක ගම්මානයක් ලෙස ස්ථාපනය කිරීමේ වැදගත්කම අවධාරණය කළ අතර ඒ සඳහා ගත යුතු ක්‍රියා මාර්ග පිළිබඳව ද විස්තර කළේය. සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත ක්‍රියාකාරකම් තුළින් කිතුල් කර්මාන්තයට අමතර ආදායමක් උපයා ගැනීමේ හැකියාව ඔහුගේ වටිනා තීක්ෂණ බුද්ධියෙන් ඉස්මතු විය.

සංචාරක ගම්මානයේ ඉදිරි කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා තෝරා ගත් කිතුල් ව්‍යවසායකයින් පිරිසකගෙන් සැදුම් ලත් ''සිංහරාජ සුමිතුරෝ'' නම් සංවිධානය පිහිටුවීම මෙහි දී සිදු වූ විශේෂ සිදුවීමකි.

## 8.6 උසස් තත්වයේ කිතුල් නිෂ්පාදන අලෙවි කිරීමට අවශ්‍ය තාක්ෂණික මැදිහත් වීම්.

මෙය කිතුල් සමිති පිහිටුවීම සහ බල ගැන්වීමේ ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වන තවත් ක්‍රියාකාරකමකි. කිතුල් සමිති පිහිටුවීම සහ සවිබල ගැන්වීම අරමුණු කරගත් ව්‍යාපෘතියේ අතිරේක ක්‍රියාකාරකමක් මෙම විශ්ලේෂණය මඟින් හුවා දක්වයි. මෙම නිශ්චිත ක්‍රියාකාරකම විමසා බැලීමෙන් කිතුල් කර්මාන්තය ශක්තිමත් කිරීමට සහ ඊට සම්බන්ධ ප්‍රජාවට සහයෝගය දැක්වීමට ගන්නා උත්සාහය තවදුරටත් අවබෝධ කර ගත හැකිය. 2022.12.02 දින පවත්වන ලද මෙම වැඩසටහන සඳහා ප්‍රමුඛ පුද්ගලයින් සහ සංවිධාන කිහිපයක සහයෝගයෙන් සංවිධානය කරන ලදී.

නෙළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ශ්‍රවණාගාරයේ දී නෙළුව සහ තවලම ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශ නියෝජනය කරමින් කිතුල් ව්‍යවසායකයින් 200 කගේ සහභාගිත්වයෙන් ආරම්භ විය. කිතුල් පැණි සහ හකුරු නිෂ්පාදනය සහ අලෙවිය සඳහා විශේෂයෙන් සකස් කරන ලද ප්‍රජා මූලික ව්‍යාපාරික යන්ත්‍රණයක් ස්ථාපිත කිරීම මෙම වැඩසටහනේ මූලික අරමුණ විය. කිතුල් කර්මාන්තය බහුලව පවතින නෙළුව සහ තවලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සඳහා සුවිශේෂී සන්නාමයක් නිර්මාණය කිරීම මෙම යන්ත්‍රණයේ අරමුණ විය. මෙම නව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සහ ව්‍යාපාරික යාන්ත්‍රණය නීත්‍යානුකූලව යහපත් බව සහතික කිරීම පිළිබඳ ව වැඩසටහනේ දී අවධානය යොමු විය. වැඩසටහන අතරතුර අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ සහ හිටපු සමුපකාර කොමසාරිස් සුමින්ද සිංගප්පුලි මහතා කිතුල්වලට සම්බන්ධ පුද්ගලයින්ගේ විවිධ අවශ්‍යතා සපුරාලීම සඳහා සමුපකාර ක්‍රමයේ වැදගත්කම අවධාරණය කළේය.

ඔහු සමුපකාර ක්‍රමය පිළිබඳ මෙම විස්තරය සිදු කළේ ආර්ථික, සමාජීය සහ අනෙකුත් අත්‍යවශ්‍ය අවශ්‍යතා වලට ප්‍රමුඛත්වය දෙන කිතුල් කර්මාන්තයේ නියැලෙන්නන්ගේ ජීවනෝපායන් සවිබල ගැන්වීමට සහ වැඩිදියුණු කරන ජනතා කේන්ද්‍රීය ව්‍යාපාරික යන්ත්‍රණයක් ලෙස ය. වැඩසටහනේ දී ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය නියෝජනය කරන නියෝජ්‍ය අධ්‍යක්ෂ බන්දුල මහතා කිතුල් නිෂ්පාදන ක්‍රියාවලිය සවිබල ගැන්වීම සඳහා නව තාක්ෂණික භාවිතයන් ඒකාබද්ධ කිරීමේ වැදගත්කම අවධාරණය කළේය. උසස් තත්වයේ කිතුල් නිෂ්පාදන නිර්මාණය කිරීම, සහතික කිරීම සඳහා එවැනි ප්‍රගතියක් අවශ්‍ය බව ඔහු අවධාරණය කළේය. ගාල්ල කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ දිස්ත්‍රික් අධ්‍යක්ෂක ජයසේකර මහතා කිතුල් කර්මාන්තයේ නියැලෙන පුද්ගලයින්ට ව්‍යාපාර සංවර්ධනය හා ව්‍යවසායකත්වය සම්බන්ධ විවිධ විෂයන් පිළිබඳ දැනුම ලබා දීමේ අවශ්‍යතාවය අවධාරණය කරන ලදී.

වැඩසටහන අතරතුර දී අපනයන සංවර්ධන මණ්ඩලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයා විසින් කිතුල් නිෂ්පාදන අලෙවි කිරීම සඳහා නවීන ඇසුරුම් කරන ක්‍රම උපයෝගී කර ගැනීම පිළිබඳ වටිනා තොරතුරු බෙදා හදා ගන්නා ලදි. කිතුල් කර්මාන්තයෙන් ලැබෙන ආර්ථික ප්‍රතිලාභ උපරිම කර ගැනීම සඳහා සමකාලීන ඇසුරුම්කරණ ශිල්පීය ක්‍රම වලට ඉටු කළ හැකි වැදගත් කාර්යභාරය මෙම ඉදිරිපත් කිරීම මගින් අවධාරණය කෙරිණි.

200 ක පමණ පිරිසක ගේ සහභාගිත්වයෙන් පැවති මෙම වැඩසටහන නෙළුව සහ තවලම කිතුල් ආශ්‍රිත ව්‍යාපාරික කණ්ඩායම් දෙකෙන් ම නියෝජිතයන් දස දෙනෙක් තෝරා ගැනීමෙන් අනතුරුව අවසන් විය. කිතුල් සංවර්ධන මණ්ඩලයට සම්බන්ධ වීම සඳහා මෙම පුද්ගලයින් තෝරා ගන්නා ලද අතර අධ්‍යක්ෂක මණ්ඩලයේ ක්‍රියාකාරකම් සඳහා අන්තර්ගත නියෝජනය සහ සක්‍රීය සහභාගිත්වය සහතික කිරීමේ වැදගත් පියවරක් මෙමඟින් සනිටුහන් කරයි.

## 8.7 කිතුල් ගස් ප්‍රමාණය වැඩි කිරීම සඳහා තවාන් සංවර්ධනය හා කිතුල් වගාව රට තුළ වාණිජ මෙහෙයුමක් ලෙස පරිවර්තනය කිරීම.

ඒ අනුව කිතුල් සංවර්ධන මණ්ඩලය පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා කාර්මික තාක්ෂණික ආයතනය ඒකාබද්ධ ව මෙම ව්‍යාපෘතිය දියත් කිරීමට තීරණය කර ඇත. 2021 වර්ෂයේ දී, කිතුල් සහ තල් ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදනයේ සහ අපනයන විවිධාංගීකරණය කිරීමේ වැඩසටහනක් හිටපු පොල් රාජ්‍ය අමාත්‍යාංශය විසින් ආරම්භ කරන ලදි. පොල්, තල් හා කිතුල් වගාවන් ප්‍රවර්ධනය කෙරෙහි අවධානය යොමු කරමින්, මෙම මුලපිරීමේ කොටසක් ලෙස තාක්ෂණික පුහුණුව, කිතුල් පැල තවාන් 10 ක් සඳහා අධීක්ෂණය සහ පසු විපරම් පහසුකම් සපයනු ලැබේ.

2022.04.19 වන විට, ශ්‍රී ලංකාව පුරා විවිධ ස්ථාන වලින් පැල තවාන් 75කට අධික සංඛ්‍යාවක් නියොජනය කරමින් මෙම වැඩසටහනට සහභාගි වීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කර තිබුණි. මෙම

ව්‍යාපෘතිය සඳහා 2022 වසරේ ඇස්තමේන්තු ගත මුදල රුපියල් මිලියන 5.55 කි. එහි ප්‍රතිඵලයක් ලෙස මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකාව පුරා දියත් කිරීමට නොහැකි වීම හේතුවෙන් කිතුල් සංවර්ධන මණ්ඩලය විසින් නියමු ව්‍යාපෘතියක් ලෙස ගාල්ල දිස්ත්‍රික්කයේ පැල තවාන් 10 ක් හඳුනා ගෙන ඇත. කිතුල් තවාන් හිමියන්ට සහයෝගය දැක්වීම සඳහා පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ ගුණවර්ධන මහතා සමඟ සාකච්ඡාවක් පැවැත්විණි.

ඒ අනුව කිතුල් සංවර්ධන මණ්ඩලය, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා කාර්මික තාක්ෂණික ආයතනය එක්ව මෙම ව්‍යාපෘතිය දියත් කිරීමට තීරණය කර ඇත. ව්‍යාපෘතියේ පළමු පියවර ලෙස ගාල්ල දිස්ත්‍රික්කයෙන් නියැදි තවාන් හඳුනා ගැනීමට නියමිතව තිබුණි. මේ සඳහා පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද නිර්ණායක මත පදනම්ව හඳුනාගත් පැල තවාන් 12 ක තොරතුරු මණ්ඩලය වෙත ලබා දෙන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස මෙම තවාන් වල හිමිකරුවන් සම්බන්ධ කර ගනිමින් මූලික සාකච්ඡා වටය ආරම්භ කිරීමට මණ්ඩලය තීරණය කර ඇත.

මීට අමතරව, මෙම නියමු ව්‍යාපෘතිය සඳහා තෝරා ගෙන ඇති මුළු තවාන් සංඛ්‍යාව 19 කි. ඒ අතරතුර ගාල්ල දිස්ත්‍රික්කයෙන් අයදුම්පත් ඉදිරිපත් කළ අය අතරින් තෝරා ගත් කිහිපයක් ඇතුළුව කලින් රාජ්‍ය අමාත්‍යාංශය මූලික සාකච්ඡා වටය 2022.12.16 වන දින පැවැත්වූ අතර ඒ සඳහා නිලධාරීන් තිදෙනෙකු සහභාගි විය. කිතුල් සංවර්ධන මණ්ඩලය නියෝජනය කරමින් සභාපති නීතිඥ ගිහාන් පෙරේරා මහතා සහ සාමාන්‍යාධිකාරී ශිරාණි වීරකෝන් මහත්මිය ද කාර්මික තාක්ෂණ ආයතනය නියෝජනය කරමින් ආචාර්ය පී රණසිංහ මහතා ඇතුළු නිලධාරීන් කිහිප දෙනෙකු මේ සඳහා සහභාගි විය.

මෙම රැස්වීමට පළාත් කෘෂිකර්ම කාර්යාලය නිලධාරින්ද සහභාගී විය. සැසියෙ දී තවාන් අධීක්ෂණ වැඩසටහන් වගකීම පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂක මණ්ඩලය විසින් භාර ගන්නා ලද අතර ව්‍යාපෘතිය ආරම්භයේ සිට අවසන් කිරීම දක්වා වූ කාර්යයන් හඳුනා ගන්නා ලදි. තව ද ව්‍යාපෘතිය සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ත්‍රෛපාර්ශ්වික ගිවිසුම් සම්බන්ධයෙන් ද සාකච්ඡා කරන ලදි. සාකච්ඡා කළ පරිදි කාර්මික තාක්ෂණ ආයතනය මුලින් ම බීජ හඳුනා ගැනීමේ වගකීම බාරගනී.

පාංශු සංයුතිය පිළිබඳ තොරතුරු ඇතුළුව බීජ එකතු කරන ආකාරය ඒවා සිටුවන ආකාරය සහ සෞඛ්‍ය සම්පන්න පැළ ලබා ගන්නා ආකාරය තවාන් කරුවන්ට ඉගැන්වීමේ වගකීම ද කාර්මික තාක්ෂණ ආයතනය විසින් දරනු ලැබේ. කිතුල් පැළ නිෂ්පාදන කිරීමේ ක්‍රියාවලියේ දී කිතුල් බීජ ලබා දීම සහ තවාන් හිමියන්ගේ ඉඩම් ප්‍රයෝජනයට ගැනීම මෙන් ම ජලය, පස, ශ්‍රමය සහ අනෙකුත් අවශ්‍ය යෙදවුම් ද ඇතුළත් වේ.

පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව තවාන් හිමියෙකු සඳහා එක් පැලයක් පිරිවැය ගණනය කරයි. ඒ අනුව එක් පැළයක් සඳහා නියම කර ඇති මිල රු.100 කි. ආචාර්ය රණසිංහගේ අධ්‍යයනයෙන් හෙළි වූයේ බීජ සිටවීමේ සිට බීජ පැළ අවදිය දක්වා කාලය මාස දෙක තුනකි. ව්‍යාපෘතිය සඳහා බීජ ලබා ගැනීමේ කාලය ජනවාරි මාසයේදී මුලින් සැලසුම් කර තිබූ අතර අප්‍රේල් මැයි මාසයේ මිල දී ගැනීමේ කාලය ජුනි දක්වා නැවත සකස් කර ඇත. අපගේ ආයතනය පැල තවාන් 10ක් හඳුනාගෙන ඇති අතර වගා කිරීමට නියමිත මුළු පැළ සංඛ්‍යාව 50,000කි. මෙම පැල මිලදී ගැනීම සඳහා මණ්ඩලයේ අයවැය රුපියල් මිලියන 5කි. කෙසේ වෙතත් මණ්ඩලයේ මිල දී ගැනීම් ඒ සීමාවන් හේතුවෙන් ව්‍යාපෘතිය අත්හිටවීමට ද සිදුවිය.

## 09. විගණකාධිපති වාර්තාව

**ජාතික විගණන කාර්යාලය**
**தேசிய கணக்காய்வு அலுவலகம்**
**NATIONAL AUDIT OFFICE**

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | පීඒඑල්/ඊ/කේඩීබී/01/23/02 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2025 ජූලි 14 දින |

සභාපති

කිතුල් සංවර්ධන මණ්ඩලය

**කිතුල් සංවර්ධන මණ්ඩලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

කිතුල් සංවර්ධන මණ්ඩලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

Ms. Anuradhika / IA acty.

F.N.A. Pl.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07හි 69 ඡේදය ප්‍රකාරව මණ්ඩලය විසින් 2022 අප්‍රේල් මස මිලදී ගත් එකතුව රු. 378,891ක් වූ ලී බඩු හා සවි කිරීම් වලට අදාළව අවශ්‍ය ක්ෂය වෙන්කිරීම් මූල්‍ය ප්‍රකාශනවල සලකා නොතිබුණි.

(ආ) 2022 දෙසැම්බර් මසට අදාළ එකතුව රු. 631,236ක් වූ වියදම් 2023 වර්ෂයේ ගෙවා තිබුණද 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ඒ සඳහා වෙන් කිරීම් කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මණ්ඩලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් මණ්ඩලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තියේ ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනායාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති/ විධානයට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති අංක පීඊඩී 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.6 වගන්තිය | ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත් 2022 වර්ෂයට අදාළ ගිණුම් විගණනයට ඉදිරිපත් වූයේ 2025 මාර්තු 20 දින වන අතර එහි ප්‍රමාද කාලය වර්ෂ 02 ක් වේ. |

**2.2.3** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ළ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

**2.2.4** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ළු) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

ජී.එච්.ඩී.ධර්මපාල
විගණකාධිපති (වැ.බ)

6

# 10. මූල්‍ය වාර්තා

## 10.1 මූල්‍ය තත්ව ප්‍රකාශය

**Kithul Development Board**
**Statement of Financial Position**
**as at 31st December 2022**

| | Note | 31.12.2022 Rs. |
|---|---|---|
| **ASSETS** | | |
| **Non- Current Assets** | | |
| Property, Plant and Equipment | 1 | 378,891.00 |
| **Current Assets** | | |
| Cash balance at BOC Pelwatta Acct | | 335,581.58 |
| Total Assets Value | | 714,472.58 |
| **Less : Liabilities** | | |
| **Current Liabilities** | | |
| Dist Secre- Nuwara Eliya | | (308,613.36) |
| Total Net Assets | | **405,859.22** |
| Represented BY, | | |
| Total Revenue Reserves | 2 | **405,859.22** |

Theses Financial Statements have been prepared in accordance with Sri Lanka Public sector Accounting Standards (SLPSAS)

..................................
**S.C.S Fernando**
Asst/Dep Manager Finance (Acting)
Kithul Development Board

**S.C.S. Fernando**
Asst/Deputy Manager (Finance)
Kithul Development Board

..................................
**Gihan Perera ( Attorney At Law )**
Chairman
Kithul Development Board

**GIHAN PERERA** (AAL, MAHRM, Dip-Mng)
**CHAIRMAN**
**Kithul Development Board**
**No: 23/1, Kandawatte Road,**
**Pelawatte, Battaramulla.**

The Accounting Policies and Notes are integral part of these Financial Statements.
The board of Directors is responsible for the preparation and presantation of these Financial Statements.
Financial Statements for 2022 in the Kithul Development Board were approved by the Board of Directors and signed on theie behalf.

..................................
**P.D.H.Dabare**
Director
Ministry of Finance

..................................
**Dr.Raveendra Withanachchi**
Director
University of Sri Jayewardenepura

..................................
**Dr.P.Ranasinghe**
Director
Industrial Technology Institute

..................................
**D.M.M.Dissanayake**
Director
Ministry of Plantation Industries

..................................
**R.U.Primal Fernando**
Director

## 10.2 මූල්‍ය කාර්ය සාධනය

# Kithul Development Board
## Statement of Financial Performance for the Year Ended 31 st DECEMBER 2022

| | | | Rs. |
|---|---|---|---|
| Operating Revenue | | | |
| | Government Recurrent Grant | | 11,246,250.44 |
| | Government Capital Grant | | 6,651,332.48 |
| Total operating revenue | | | 17,897,582.92 |
| **Less: Development Programme expenses - 2022** | | | |
| | Proj 01 exp | 4,122,466.48 | |
| | Proj 02 exp | 149,975.00 | |
| | Proj 03 exp | 1,829,035.00 | |
| | Proj 06 exp | 170,965.00 | |
| | | | (6,272,441.48) |
| Net surplus before the operating expenses | | | 11,625,141.44 |
| **Less :Operating Expenses** | | | |
| 1001 | Salaries & Wages | 3,277,119.78 | |
| 1002 | Overtime & Holiday payments | 80,466.89 | |
| 1003 | Other Allowance | 332,322.58 | |
| 1201 | Stationaries and office requirements | 319,166.62 | |
| 1202 | Fuel | 1,139,190.00 | |
| 1301 | Vehicles Maintain | 739,004.00 | |
| 1401 | Transport | 2,410,090.00 | |
| 1402 | Postal & Communication exp | 89,767.85 | |
| 1403 | Electricilty & Water | 77,205.50 | |
| 1404 | Rent | 2,259,075.00 | |
| 1409 | Other | 495,874.00 | |
| | | | (11,219,282.22) |
| Net surplus generated during the year | | | **405,859.22** |

## 10.3 මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

**Kithul Development Board**
**Statement of Cash flow as at 31.12.2022**

| | As at 2022.12.31 |
|---|---|
| **Cash flow from operating activities** | |
| Net surplus/ (Deficit) for the year | 405,859 |
| Adjustment for | |
| Depreciation | - |
| | 405,859 |
| Working capital Changes | |
| (Increase)/decrease in trade & other receivables | - |
| Increase/(decrease) in trade & other payables | 308,613 |
| Cash generated from operating activities | 714,473 |
| **Cash generated from Investing activities** | |
| (Purchase)/ disposal of PPE during the year | (378,891) |
| Cash generated from financing activities | - |
| Net increase/ (decrease) in cash & cash quivalent during the year | 335,582 |
| Cash & cash equivalent at the beginning of the year | - |
| Cash & cash equivalent at the end of the year | **335,582** |

## 10.4 දේපළ, පිරියත , උපකරණ

**Note 01** **Property, Plant and Equipments**

Property, plant & Equipmen

| Discription | Balance as at 01.01.2022 | Additions | Disposal | Balance as at 31.12.2022 |
|---|---|---|---|---|
| Office Tables | - | 359,992 | - | 359,992 |
| Office Cupboads | - | 18,899 | - | 18,899 |
| | - | 378,891 | - | 378,891 |

| | Cum depreciate as at 01.01.2022 | Depreciation for the year | Depreciation on disposal | Cum depreciate as at 31.31.2022 |
|---|---|---|---|---|
| Office Tables | - | - | - | - |
| Office Cupboads | - | - | - | - |
| | - | - | - | - |
| Net Book Value | **-** | | | **378,891** |

**Note 02** **Revenue Reserves**

| | **Retained earninngs** **Rs.** |
|---|---|
| Balance as at 01.01.2022 | - |
| surplus/(deficit) for the year | 405,859 |
| Balance as at 31.12.2022 | **405,859** |

## 10.5 සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති

**KITHUL DEVELOPMENT BOARD**
**NOTES TO THE FINANCIAL STATEMENTS**
**YEAR ENDED 31ST DECEMBER 2022**

**1. CORPORATE INFORMATION**

Domicile and Legal Form
Kithul Development Board incorporated under "THE COCONUT DEVELOPMENT ACT, No 46 of 1971."
The address of the Institute is located at 239/1" Kandawaththa Road, Pelawaththa, Baththaramulla.

**1.2 Principal activities & Nature of Operations**

1. The Development and Assistance in the development of the productivity of land in Kithul Plantation
2. The Cultivation and Assistance in and promotion and regulation of the cultivation
3. The specification polarization and direction of proper cultivation practices in respect of the growing of Kithul and other crops in Kithul plantation
4. The Manufacture; and assistance in and promotion and regulation of the manufacture, of Kithul products
5. The promotion of new techniques in the processing of Kithul products
6. The Prescription and maintenances of standards of quality of Kithul products manufactured in or exported Form Sri Lanka
7. The export and import and the regulation of the export and import and of the export price and import prices of the Kithul Products
8. The conducting of Market research into all aspects of the transport and marketing Kithul products with and outside Sri Lanka
9. The establishment and maintenances of research in states, experiment station and nurseries
10. The guiding and Advising of the Kithul Industry on all matters of a technical name
11. The Promotion of Co-operative and collective form of management and ownership of Kithul plantation and of establishments manufacturing or trending in Kithul Products

**2. SIGNIFICANT ACCOUNTING POLICIES**

**2.1 General Policies**

**2.1.1 Basis of Preparation**

The financial statement of the Board such comprise statement of financial position. Statement of financial performance, statement of charges of equity, statement of Cash Flow, statement of Budgeted and actual performance together with the significant Accounting Policies and Note to the Financial Statement which have been prepared in accordance with Sri Lanka Public Sector Accounting Standards on the accrual basis of accounting formulated by Association of Public Finnane Accountants O Sri Lanka.

5 | Page

### 2.1.2 Basis of Measurement

The Financial Statement have been prepared accordance with the historical cost conversion basis.

### 2.1.3 Summary of Significant Accounting Policies

Financial statement has been prepared on a going concern concept and the account policy has been applied consistently throughout the period. Fund is available for government grants. Government grant is Utilized to meet institutional liabilities as and when necessary.

The principal accounting policies applied in the preparation of financial statements are set out below. These policies have been consistently applied in all years presented unless otherwise stated.

## 3.VALUATION OF ASSETS THEIR MEASUREMENT BASE

### 3.1 Inventories

Inventories are valued at the lower of cost and realizable value, after making due allowances for obsolete and slow-moving items. Net realizable value is the price at which inventories can be sold in the ordinary course of business less the estimated cost of completion and the estimated cost necessary to make the sale. The cost incurred in bringing inventories to the present location and condition are accounted using the following cost formular;

| | |
|---|---|
| Raw Materials | - At actual cost in FIFO Basis |
| Work -In-Progress | - At the cost of direct materials, labor and an Appropriate portion of fixed production overheads Based on normal operating Capacity. |
| Finished Goods | - At the cost of direct materials, labor and. appropriate portion of fixed production overheads base on normal operating capacity |
| Consumables & Spares | - At actual cost on FIFO Basis |
| Packing/Indirect and Other Stocks | - At actual cost on FIFO basis |

### 3.2 Cash & Cash Equivalents

Cash and cash equivalents are defined as cash in hand, demand deposits short term highly liquid investments readily convertible to know amount of cash and subject to insignificant risk of change of value.

For the purpose of cash flow statement cash and cash equivalents consist of cash in hand and deposits in bank net of outstanding bank overdrafts. The cash flow statements are reported based in indirect method.

### 3.3 Property Plant & Equipment

#### 3.3.1 Cost/Valuation

Property Plant & Equipment are stated at historical cost less accumulated depreciation and accumulated impairment losses. This historical cost includes all cost directly attributable to bringing as asset to working condition for its intended use and significant renovation.

When part of an item of property Plant & Equipment has different useful lives, they are accounted for as separate items (Major Component) of Property Plant & Equipment.

#### 3.3.2 Restoration Costs

Expenditure incurred as repairs or maintenance of Property Plant & Equipment in order to restore or maintain the future economic benefits expected form originally assessed standard of performance is recognized as an expense when incurred

#### 3.3.3 Depreciation

Depreciation is calculated using straight line method based on rates estimated to write-off the assets over the term of its useful life living a residual value for accounting purpose.

| *Asset* | *Percentage* |
|---|---|
| Equipment | 20% |
| Office Furniture | 20% |
| Computer | 20% |

Kithul Development Board now determine the depreciation charge separately for each significant part of an item of property, plant and equipment and begin to depreciate when it is available for use, rather than adopting a method whereby property, plant and equipment are depreciated fully in the year of disposal with no such charge being accounted for in the year of purchase.

### 4. Liabilities and provisions

4.1 Provisions

Provisions are recognized when the fund has a percent obligation (legal or constructive) as result of a past event, where it is probable that an overflow of resources embodying economic benefits will be required to settle its obligation and a reliable estimate can be made of the amount of the obligation.

### 5. Income Statement

#### 5.1 Revenue Recognition

##### 5.1.1. Government Grant

The Department of National budget allocates significant amount of fund from the annual budget & the Institute recognizes the both re-current and capital grant as the income of the Institute and capitalized by the capital goods purchased excluding development expenditure from capital grant in accordance with the SLPSAS II

## 11.ජාතික විගනණ වාර්තාවේ පෙන්වා දී ඇති දුර්වලතා නිවැරදි කිරීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග

I. විගණකාධිපති වාර්තාව 1.2 (අ) සහ (ආ) මගින් පෙන්වා දී ඇති අඩුපාඩු 2023 වර්ෂය සඳහා අවසාන ගිණුම් පිළියෙළ කිරීමේදී නිවැරදි කරන ලදි.

II. මණ්ඩලයේ පෙර වර්ෂ සඳහා වන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම කඩිනමින් අවසන් කර ඉදිරි වර්ෂ සඳහා තත්කාලීනව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඉදිරිපත් කළ හැකි පරිදි කටයුතු සැලසුම් කිරීම.